SANRAKSHA
සංරක්ෂා
ත්‍රෛමාසික පුවත් සංග්‍රහය

ශ්‍රී ලංකා
සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2026 සැප්තැම්බර් - 19 වන කාණ්ඩය - තෙවන කලාපය - ISSSN 2021 9521

දේශයේ පුනර්ජනනීය බලශක්ති පෙරළිය



5 අනාගතය වෙනුවෙන් පෙළ ගැසෙන මෙරට සුළං බල ව්‍යාපෘති

12 ගලා යන ජල ධාරාවන්ට ඉහළින් සූර්යය පැනල සවි කිරීම

14 සූර්ය බලශක්ති පද්ධති සහ බැටරි ගබඩා පද්ධති (BESS) සඳහා වූ නව නියාමන රාමුව

SANRAKSHA
සංරක්ෂා
ත්‍රෛමාසික පුවත් සංග්‍රහය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රකාශනයකි

කතුවැකිය

දේශයේ
පුනර්ජනනීය බලශක්ති පෙරළිය

"බලශක්ති සුරකින ශ්‍රී ලංකාවක්" ගොඩනැඟීම අරමුණු කොට 2007 දී ඇරඹූ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දශක දෙකක් වනවිට, ආනයනික පොසිල ඉන්ධන මත යැපුණ ශ්‍රී ලංකා බලශක්ති ක්ෂේත්‍රය තුල වැඩි ප්‍රතිශතයක් දේශයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් සරිකරලීමට හැකි තත්වයකට පත්කිරීමට හැකිවීම අප ආයතනය ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි.

වසර 2007 වනවිට මෙරට සමස්ත ප්‍රනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙ.වො. 118 ක් (මහා පරිමාණ ජල විදුලි බලාගාර හැර) වූ අතර එය 2026 වනවිට මෙ.වො. 3,802.6ක් දක්වා වර්ධනය වී ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි විෂයපථය මතට වැටෙන කුඩා ජල විදුලි බලාගාර ධාරිතාව මෙ.වො. 437.3 දක්වාත්, සුලං බලය මෙ.වො. 287 දක්වාත් සූර්ය බල (පොලොව මත) විදුලි ධාරිතාව මෙ.වො. 505 දක්වාත් වර්ධනය වී ඇත. එමෙන්ම මේ වනවිට පෙව ස්කන්ධ බලාගාර ධාරිතාව මෙ.වො. 64.3 හා ජලය මත පාවෙන සූර්ය බලාගාර ධාරිතාව මෙ.වො. 7කි. වහලමත සූර්ය පැනල පද්ධති ධාරිතාව මෙ.වො. 2,502කි.

මේ තත්වය, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වර්ධනය කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය නියාමන අධිකාරිය සිදුකළ මාර්ගෝපදේශයන් මෙන්ම නියාමනය කිරීම් ප්‍රබල ලෙස බලපානු ලැබ ඇත. එමෙන්ම ලොවපුරා ගොඩනැගෙන නවීන තාක්ෂණයන් මෙරටට හඳුන්වාදීම උදෙසා නියාමන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ද මෙම ප්‍රවර්ධනයට පැහැදිලි බලපෑමක් සිදුකරනු ලැබීය. උදාහරණ ලෙස මෙරට මහා පරිමාණ පළමු සූර්ය බලාගාරය ඉදිකිරීම හා පාවෙන සූර්ය බලාගාර ඉදිකිරීම පෙන්වාදිය හැක.

මෙරට සූර්යබල තාක්ෂණය තවදුරටත් භාවිතයට ගැනීම උදෙසා රට තුළ පවත්නා සීමිත භූමි ප්‍රමාණය ඉතිරි කර ගනිමින් ඉදිරි වසර තුළ රටෙහි පවත්නා ඇළ මාර්ග භාවිතයට ගනිමින් සූර්ය බලාගාර ඉදිකිරීමටත්, පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනයට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම හා ඒ සඳහා වන උපායමාර්ගික පාරිසරික බලපෑම් අධ්‍යයනය කරමින් අධිකාරිය 2030 දී දේශයේ විදුලි ඉල්ලුමෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති මඟින් සරිකරලීමේ ඉලක්කයන් අධිකාරිය විසින් සාක්ෂාත් කර ගනිමින් සිටී.

උපදේශකත්වය

මහාචාර්ය විජේන්ද්‍ර බණ්ඩාර
සභාපති

රෝහන රන්දොඹගේ
අධ්‍යක්ෂ ජනරාල්

චමිල ජයසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණ)

විමල් නදීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(සැපයුම් පාර්ශ්වීය කළමනාකරණ)

පී.පී.කේ. විජේතුංග
අධ්‍යක්ෂ (ප්‍රචාරණ හා ප්‍රවර්ධන)

අනුරුද්ධ එදිරිවීර
සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය)

සංස්කරණය
චමින්ද්‍ර ලියනගේ

සහාය සංස්කරණය
එස්.එම්. නිමල්කා සමරකෝන්

පරිගණක අක්ෂර සංයෝගය
ජනිරු පහන්මිත්

සෝදුපත් නිරවද්‍යතාව
ඥානදාස හල්ලොලුවආරච්චි

පිටු සැකසුම
සියත්රා ඇඩ්වර්ටයිසින්
0718-508050

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு வலு அதிகார சபை
Sri Lanka Sustainable Energy Authority

අංක 80, ශ්‍රීමත් ආරනස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
දුරකථනය: 011 257 5030
ෆැක්ස්: 011257 5089

පෙළගැස්ම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නව අධ්‍යක්ෂ ජනරාල් වැඩ බාරගනී	3
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිය 19 වන උපන්දිනය සමරයි	3
අනාගතය වෙනුවෙන් පෙළගැසෙන මෙරට සුළංබල ව්‍යාපෘති	4
නියමු ව්‍යාපෘතිවල සිට ජාතික පාවෙන සූර්ය බලශක්ති වැඩසටහනක් දක්වා වූ ගමන	8
ගලා යන ජල ධාරාවන්ට ඉහළින් සූර්යය පැනල සවි කිරීම	12
සූර්ය බලශක්ති පද්ධති සහ බැටරි ගබඩා පද්ධති (BESS) සඳහා වූ නව නියාමන රාමුව	14
දූපත් තුනකට විදුලිය සපයන දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය	17

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නව අධ්‍යක්ෂ ජනරාල් වැඩ බාරගනී



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නව අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස 2026 ජූලි 07 දින ඉංජිනේරු, රෝහණ රන්දොඹගේ මහතා වැඩ බාරගන්නා ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරියෙකු වන ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත්(MBA) නවසීලන්තයේ ඔක්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යලයේ ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකයකු වන ඔහු දේශීය හා විදේශීය ආයතනයන්හි වසර 24 කට වැඩි පළපුරුද්දක් සහිත විධායක නිලධාරියෙකි.

▸ අනුරුද්ධ එදිරිවීර

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිය 19 වන උපන්දිනය සමරයි





"බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්" ගොඩනැඟීමේ කාර්යය උදෙසා 2007 ඔක්තෝබර් 01 වන දින පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ උපන්දින සැමරුම ගරු විදුලිබල අමාත්‍ය අනුර කරුණාතිලක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අධිකාරියේදී පැවැත්විණි.

මෙම අවස්ථාව සනිටුහන් කරමින් අධිකාරිය වෙත නව තාක්ෂණ නිලධාරීන් අට දෙනෙකු බඳවා ගැනීම වෙනුවෙන් ගරු අමාත්‍යතුමා ඔවුන් වෙත පත්වීම් ප්‍රදානය සිදුකෙරිණි.

මෙහිදී අදහස් දැක්වූ අමාත්‍යතුමා 2030 වසරේදී මෙරට බලශක්ති ඉල්ලුමෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් සැපයීමේ ඉලක්කය ජය ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට හැකි වේවායි ප්‍රාර්ථනා කළේ ය.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ ගරු අමාත්‍යතුමා ඊයේ දින, එනම් සැප්තැම්බර් 30 වන දින සමස්ත විදුලි ඉල්ලුමෙන් 69%ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් ලබා දී ඇති බව ප්‍රකාශ කළේ ය.

මෙම අවස්ථාවට අධිකාරියේ සභාපති මහාචාර්ය විජේන්ද්‍ර ජේ. බණ්ඩාර මහතා සහ අධ්‍යක්ෂ ජනරාල් රෝහණ රන්දොඹගේ මහතා ඇතුළු අධිකාරියේ සියලු සාමාජිකයින් සහභාගි විය.

▸ නිමල්කා සමරකෝන්



ඉංජිනේරු චතුර වන්නිආරච්චි
සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

අනාගතය වෙනුවෙන් පෙළගැසෙන මෙරට සුළංබල ව්‍යාපෘති

මෙරට ජනයා සුළං බලය භාවිතයට ගැනීම ආරම්භ කර තිබෙන්නේ අනාදිමත් කාලයක සිට ය. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදී මෙරට ජීවත් වූ ජනයා යකඩ උණු කිරීම සඳහා සුළඟ භාවිතයට ගත් බව පර්යේෂණ මඟින් තහවුරු කෙරී ඇත. සුළං බලය කාර්මික භාවිතයන් සඳහා යොදාගත් ලොව මුල්ම ජන කොටස් අතර මෙරට ජනයා සිටින බව විද්‍යාඥයෝ ඒ අනුව සඳහන් කරති. ශ්‍රී ලංකාවට බලපාන මෝසම් සුළංවලට මුහුණ ලා තනන ලද උදුන්වල යකඩ උණු කළ බවටත් එම උදුන්වල උෂ්ණත්වය ඉහළ මට්ටමක රඳවා ගැනීමට සුළඟ භාවිතයට ගත් බවටත් තොරතුරු හමු වී ඇත. මෙරටට ලැබෙන සුළඟ එදා ඒ අන්දමට ප්‍රයෝජනයට ගත් මෙහි ජනයා සුළඟ භාවිතයෙන් බලශක්ති අවශ්‍යතා ප්‍රශස්ත මට්ටමෙන් සපුරා ගැනීමට දැන් සැරසෙති. එහිලා ගොඩබිම පවතින සුළඟ මෙන්ම ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ පවතින සුළඟත් භාවිතයට ගැනීමට පිඹුරු පත් සකස් කෙරෙමින් ඇත. එය සුළං බල භාවිතයේ විප්ලවීය ඉදිරි පියවරකි. ඒ ඉදිරි පියවර සඳහා අවශ්‍ය අධ්‍යනයන් සහ සුළං මිනුම් කටයුතු මේ වනවිටත් සිදු කෙරෙමින් පවතින බව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ, ඉංජිනේරු චතුර වන්නිආරච්චි මහතා පවසයි. "සංරක්ෂා" සඟරාවට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් ඒ මහතා මේ බව සඳහන් කළේ ය.

ප්‍රශ්නය: මෙරට සුළං බල භාවිතය නවමු මඟකට යොමු කෙරෙමින් තිබෙන්නෙ. එහිලා ක්‍රියාත්මක කිරීමට යෝජිත සුළං බල ව්‍යාපෘති මොනවා ද?.

පිළිතුර: මහා පරිමාණ සුළං ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර අප මේ අවස්ථාව වන විට ගනිමින් සිටින්නේ. එයින් ප්‍රධාන තැනක් ගන්නෙ පුනරින් සුළං බල උද්‍යානය. වෙරවිල් සුළං උද්‍යානය තවත් වැදගත් සුළංබල ව්‍යාපෘතියක්. එහි ධාරිතාව මෙගාවොට් 204ක් පමණ වෙනවා. කරච්චි කන්දවලෙයි සුළං බල ව්‍යාපෘතිය සම්බන්ධයෙනුත් වැඩකටයුතු මේ වනවිට කෙරීගෙන යනවා. එය මෙගාවොට් 120ක පමණ ව්‍යාපෘතියක්. ඉහත ව්‍යාපෘති තුන ස්ථාපනය කරනු ලබන්නේ කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුලය. මන්තායි බටහිර (Manthai West) නමින් තවත් සුළං බල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙනවා. එය අයත් වන්නෙ මන්නාරම දිස්ත්‍රික්කයට. එය මෙගාවොට් 300ක පමණ සුළං බලාගාරයක් වනු ඇති. ඉදිරියේදී කෙරෙන්නට නියමිත මහා පරිමාණ සුළං බල ව්‍යාපෘති හැටියට ඒවා හඳුන්වා දෙන්න පුළුවන්.

ප්‍රශ්නය: පුනරින්හි ස්ථාපනය කෙරෙන සුළං බල ව්‍යාපෘතියක් ගැන ඔබ සඳහන් කළා. එය කවර ධාරිතාවක් උත්පාදනය කෙරෙන සුළං බලාගාරයක් ද?.

පිළිතුර: පුනරින් සුළං බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන්නෙ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පුනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මුල් කරගෙන. එය මෙගාවොට් 234ක් උත්පාදනය කළ හැකි සුළං බල ව්‍යාපෘතියක්. එහි ටර්බයින් 45ක් පමණ ස්ථාපනය කළ හැකි බව අප මේ වනවිට හඳුනාගෙන තිබෙනවා. එම ව්‍යාපෘතියෙන් ජනනය කෙරෙන විදුලිය ජාතික පද්ධතියට එකතු කිරීම සඳහා

සැලසුම් කරනවා.

ප්‍රශ්නය: පුනරින් ව්‍යාපෘතියෙහි කටයුතු මේ වනවිට කවර මට්ටමක ද පවතින්නෙ?.

පිළිතුර: ව්‍යාපෘතියට අදාළ භූමි අත්පත් කරගැනීම, පරිසර ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම සහ ව්‍යාපෘතියට සම්බන්ධ සියලු අනුමැතීන් ලබාගැනීම ආදිය මේ වනවිට සම්පූර්ණ කර තිබෙනවා.එකී කටයුතුවලින් සෑහෙන ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියත් මැදිහත් වුණා. ව්‍යාපෘතියට අදාළ විදුලි සම්ප්‍රේෂණ මාර්ගය පමණක් තවමත් සංවර්ධනය කෙරී නැහැ.

ප්‍රශ්නය: පුනරින් ව්‍යාපෘතියට ආයෝජකයෙක් බලාපොරොත්තුවෙන් ද මේ වනවිට පසුවෙන්නෙ?.

පිළිතුර: ඔව්; ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පාර්ශ්වයෙන් සිදු කළ යුතු සියලු කටයුතු සිදු කර අවසන්. දැන් තිබෙන්නේ ආයෝජකයකු සම්බන්ධ කර ගැනීමේ කාර්යය. ඒ සම්බන්ධයෙන් වූ කටයුතු දැනට කෙරෙමින් තිබෙනවා. අනාගතයේදී ඒ සඳහා ආයෝජකයකු සොයා ගැනීමට හැකි වෙයි.

ප්‍රශ්නය: මෙයට කලකට ඉහතදී පුනරින්හි බලශක්ති උද්‍යානයක් ඉදි කිරීම සඳහා කටයුතු සංවිධානය කෙරුණා. ඔබ ඉහත සඳහන් කළේ එකී ව්‍යාපෘතියමද?.

පිළිතුර: ඔව්; ඒ ව්‍යාපෘතියමයි. දෙමුහුම් බලශක්ති උද්‍යානයක් ලෙසයි, එය එකල ඉදිකිරීමට යෝජිතව තිබුණෙ. එහි සූර්යය බලාගාරයක් ඉදිකිරීමටත් සැලසුම් කර තිබුණා. නමුත් සූර්යය බලාගාරය ඉදිකිරීමට පෙර සුළං බලාගාරය ඉදිකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී තිබෙනවා. සුළං බලාගාරය ඉදිකර පසුව සූර්යය බලාගාරය ඉදිකිරීමට නැඹුරු වීම සඳහායි දැනට සැලසුම තිබෙන්නෙ.

ප්‍රශ්නය: ඔබ වෙරවිල් සුළං බල ව්‍යාපෘතිය ගැනත් සඳහන් කළා. එහි මේ වනවිට සිදු කෙරෙන්නෙ කවර ආකාරයේ සංවර්ධන කටයුතු ද?.



පිළිතුර: වෙරවිල් ව්‍යාපෘතිය කෙරෙන්නෙ කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පුනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. මෙගාවොට් 6 බැගින් වන ටර්බයින් 34ක් වෙරවිල් සුළං බල ව්‍යාපෘතියේ ස්ථාපනය කිරීමට නියමිතයි. එමඟින් මෙගාවොට් 204ක පමණ ධාරිතාවක් උත්පාදනය කෙරෙනු ඇති. පරිසර අධ්‍යන වාර්තාව සැකසීම මේ වනවිට සිදු කෙරෙමින් තිබෙනවා. වෙරවිල් සුළං බල ව්‍යාපෘතියට අදාළ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙනවා. ව්‍යාපෘතියට අදාළ සම්ප්‍රේෂණ පද්ධතියටද සැලසුම් සකස් කෙරෙමින් තිබෙනවා.

ප්‍රශ්නය: කරච්චි කන්දවලෙයි සුළංබල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ වනවිට සිදු කෙරෙන්නෙ කවර ආකාරයේ කටයුත්තක් ද?.

පිළිතුර: එම සුළං බලාගාරය ඉදි කෙරෙන්නෙ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි සහ කන්දවලෙයි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක මුල් කරගෙන. මෙම ව්‍යාපෘතිය තිබෙන්නෙ මූලික අදියරේ. එහි ටර්බයින් 20ක් පමණ ස්ථාපනය කළ හැකි බව අපට පෙනී ගොස් තිබෙනවා. එයට අදාළ සම්ප්‍රේෂණ මාර්ග සැකසීමත් තවම සිදු කර නැහැ. පරිසර අධ්‍යයන වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කෙරෙමින් පවතිනවා. ඒ අනුව පරිසර අධ්‍යයන වාර්තාව සැකසීම සඳහා සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙනවා.

ප්‍රශ්නය: මන්තායි වෙස්ට් එසේත් නැත්නම් මන්තායි බටහිර ව්‍යාපෘතිය කෙසේ ද සැලසුම් කෙරෙන්නේ?.

පිළිතුර: ඔව්, එම ව්‍යාපෘතියෙන් මෙගාවොට් 300කට ආසන්න ධාරිතාවක් උත්පාදනය කර ගත හැකිවෙතැයි බලාපරොත්තු තබා තිබෙනවා. ටර්බයින් ස්ථාපනය කළ හැකි ස්ථාන හඳුනාගැනීමේ කටයුතු ආරම්භ වී ඇති බව සඳහන් කරන්න ඕනෙ. ව්‍යාපෘතිය සැලසුම් කිරීමට වැදගත් වන ශක්‍යතා අධ්‍යයන පටන් ගෙන තිබෙනවා. ඉදිරියේදී එම ව්‍යාපෘතිය සම්බන්ධ පරිසර අධ්‍යයන වාර්තාව සැකසීමේ කටයුතු ඇරඹෙන්න නියමිතයි.

ප්‍රශ්නය: සුළංබල ව්‍යාපෘති රාශියක් පිළිබඳව ඔබ සඳහන් කළා. මේ ව්‍යාපෘතිවලින් විදුලිය උත්පාදන කටයුතු ආරම්භ කෙරෙන්නේ කවර කාලවලදී ද?.

පිළිතුර: වෙරවිල් ව්‍යාපෘතිය සඳහා ආයෝජකයකු තෝරා ගැනීමට අදාළ ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීම 2029 වසරේ දෙවන කාර්තුවේදී පමණ කළ හැකි වෙයි. කරච්චි කන්දවලෙයි සුළංබල ව්‍යාපෘතිය සඳහා ආයෝජකයකු තෝරා ගැනීමේ ටෙන්ඩර් 2030 වසරේ පළමු කාර්තුවේදී ක්‍රියාත්මක කිරීමට හැකි වෙයි කියා බලාපොරොත්තු වෙනවා. මන්තායි බටහිර

සුළං බල ව්‍යාපෘතිය සඳහා ආයෝජකයන් කැඳවීම සිදු කළ හැකි වන්නේ 2030 වසරේ අවසන් භාගයේදී පමණ.

ප්‍රශ්නය: නව සුළං බලාගාර සැලකිය යුතු ප්‍රමාණයක් ස්ථාපනය කෙරෙන්නෙ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බව පෙනී යනවා. එවැනි තත්ත්වයක් මතුව තිබෙන්නෙ ඇයි?.

පිළිතුර: පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් වන සැලසුම සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් සකස් කෙරෙනවා. එම සැලසුම වසර 5ක කාල පරාසයකට සැලසුම් කරනු ලබන අතර, සැලසුම ක්‍රියාවට නැංවූ වර්ෂයේ සිට වසර තුනකට වරක් එය යාවත්කාලීන කරනු ලබනවා. ඒ ඒ ප්‍රදේශ වල පවතින සුළඟේ විභවය හා ව්‍යාපෘති සඳහා ශක්‍යතාවක් පවතින භූමි ප්‍රමාණය අනුව ජනනය කරගත හැකි මෙගාවොට් ප්‍රමාණය ගණනය කර තිබෙනවා. මෙයට අමතරව හඳුනාගත් ප්‍රදේශවල සුළං මිනුම් කටයුතු සිදු කරනු ලබනවා. එම මිනුම් කටයුතු සහ ගණනයන් මත පදනම් වෙලා, තමයි සුළං බලාගාර ඉදි කළයුතු ස්ථාන පිළිබඳව නිගමනයකට පැමිණ තිබෙන්නේ.

ප්‍රශ්නය: ඉහත සඳහන් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසුව තවදුරටත් සුළං බලාගාර ඉදිකිරීමට පුළුවන් වෙතැයි සිතිය හැකි ද?.

පිළිතුර: මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමග පහසුවෙන්ම සුළං බලය ලබාගත හැකි ස්ථාන බොහෝදුරට අඩු වෙනවා. මේ අවස්ථාවෙදි අපි මුල් තැන දෙන්නෙ වෙරළ තීරය ආශ්‍රිත සුළං බලයට. ඒ හැරුණම උතුරුමැද පලාත ආශ්‍රිතවත් ඉහළ සුළං විභවයක් තිබෙන බව හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී අප ඒ සඳහාත් යොමු වෙන්න නියමිතයි.

ප්‍රශ්නය: වෙරළ තීරයෙන් ඔබ්බෙහි පවතින සුළඟ ඒ කියන්නේ අක්වෙරළ සුළඟ (offshore wind) ප්‍රයෝජනයට ගෙන විදුලිය උත්පාදනය කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකාව සතුව නැද්ද?.

පිළිතුර: අක්වෙරළ සුළං බලය ප්‍රයෝජනයට ගැනීමේ ඉතා ඉහළ හැකියාවක් ශ්‍රී ලංකාව සතුයි.

ප්‍රශ්නය: ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්වෙරළ සුළං බලය ගැන තවදුරටත් විස්තර කළොත්...?...

පිළිතුර: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, බලශක්ති අමාත්‍යාංශය, ලෝක බැංකුව සහ එක්සත් රාජධානි තානාපති කාර්යාලය යන ආයතනවල එකතුවෙන් ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්වෙරළ සුළං බලය ගැන අධ්‍යයනයන් සිදු කර තිබෙනවා. මන්නාරම මුහුදු ප්‍රදේශයෙන්, සාමාන්‍යයෙන් මෙගාවොට් 1,000ක් පමණ මූලික අදියරේදී ලබාගත හැකි වෙතැයි එම අධ්‍යයනවලින් පසුව ගණන් බලා තිබෙනවා. එම උත්පාදනය සඳහා සුදුසු ප්‍රදේශ ලෙස මන්නාරම් ද්වීපයේ මන්නාරම දූපතට දකුණින් පිහිටි ප්‍රදේශයක් දැනටමත් හඳුනා ගෙනයි තිබෙන්නේ.

ප්‍රශ්නය: අක්වෙරළ සුළං බලය භාවිතයෙන් විදුලිය උත්පාදනය සඳහා පියවර ගන්නවා ද?

පිළිතුර: ඒ සඳහා අවශ්‍ය සැලසුම් අප මේ වනවිට සකස් කර තිබෙන්නේ.

ප්‍රශ්නය: අක්වෙරළ සුළං බලයෙන් උත්පාදනය කෙරෙන විදුලිය කවර කාලයේදී අපට පරිහරණය කරන්න ඉඩ ලැබෙයි ද?.

පිළිතුර: මෙයට පෙර සැලසුම් කර තිබුණේ 2035 - 2039 අතර කාලයේදී එම විදුලිය උත්පාදනය කර ජාතික පද්ධතියට එකතු කරගත හැකි වෙතැයි කියා. කෙසේ වෙතත් එම විභවය භාවිතයට ගැනීමට පළමුව මූලික අධ්‍යයන කටයුතු රාශියක් සිදු කළයුතුව තිබෙනවා. එම අධ්‍යයන කටයුතු සිදු කර අවසන් වනවිට අවුරුදු 8ක් පමණ ගතවනු ඇතැයි සිතන්න පුළුවන්.


ප්‍රශ්නය: මන්නාරම මුහුදු ආශ්‍රිතව හැරුණු විට මෙරටට අයත් වෙනත් මුහුදු තීර ආශ්‍රිතව ඉහළ විභවයක් සහිත අක්වෙරළ සුළං බලය ඇතැයි අනාවරණය වී තිබෙනවාද?.

පිළිතුර: ඔව්; පුත්තලම මුහුදු තීරය ආශ්‍රිත තිබෙන අක්වෙරළ සුළඟ, විදුලිය උත්පාදනය කිරීම සඳහා භාවිතයට ගත හැකි බවට තහවුරු වී තිබෙනවා. එහි ඇති සුළං බලය භාවිතයට ගෙන මූලික අදියරේදී මෙගාවොට් 500ක් පමණ උත්පාදනය කරගත හැකි වෙතැයි පැවසෙනවා. හම්බන්තොට මුහුදු තීරය ආශ්‍රිතවත් ඉහළ අක් සුළං විභවයක් තිබෙන බව අධ්‍යයනවලින් අනාවරණය වී තිබෙනවා. හම්බන්තොට මුහුදු තීරයේ අක්වෙරළ සුළං විභවය සම්බන්ධයෙන් පුළුල් අධ්‍යනයන තවදුරටත් සිදු වියයුතුයි. ඉදිරියේදී එම අධ්‍යයනය සිදුවෙයි. ඒ වගේම ත්‍රිකුණාමලයට ආසන්න මුහුදු තීරයේත් ඉහළ අක්වෙරළ සුළං විභවයක් තිබෙන බව චන්ද්‍රිකා තොරතුරුවලින් තහවුරු වී තිබෙනවා. නමුත් ඒ ආශ්‍රිතව සුළං කුලුනු ඉදිකර සුළං මැනීමේ කටයුතු සිදු කර නැහැ. නමුත් ඉදිරියේදී එම මිනුම් කටයුතු සිදු කෙරෙන්න නියමිතයි.



ප්‍රශ්නය: ශ්‍රී ලංකාව ආශ්‍රිත මුහුදු තීරයේ අක්වෙරළ සුළං බලය පාවිච්චියට ගෙන සම්පූර්ණයෙන් ම උත්පාදනය කරගත හැකි විදුලිය ප්‍රමාණය සම්බන්ධයෙන් ගණනයන් තිබෙනවා ද?.

පිළිතුර: ශ්‍රී ලංකාව වටා ඇති සුළං බලය සිතියම් ගත කර තිබෙනවා. එම අධ්‍යයනවලින් තහවුරු වී තිබෙන්නේ මෙරට මුහුදු තීරයේ ඇති අක්වෙරළ සුළං බලය ප්‍රයෝජනයට ගෙන සාමාන්‍යයෙන් ගිගාවොට් 56ක පමණ ධාරිතාවක් නිපදවා ගන්න පුළුවන් බව. ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීමේදී මේ ජනනය කරගත හැකි මෙගාවොට් ප්‍රමාණය මෙයට වඩා අඩු වෙනවා. අක්වෙරළ සුළං බලය ලබා ගැනීම අපි දෙආකාරයකට වෙන් කර තිබෙනවා. එනම් සුළං ටර්බයිනය මුහුදු පතුලට සම්බන්ධ කර විදුලිය උත්පාදනය කර ගැනීම (bottom-fixed wind turbµne) සහ මුහුදු ජලය මත පාවෙන සුළං ටර්බයින (floating wind turbine) වශයෙන්. මුහුදු පතුලට සම්බන්ධ කළ සුළං ටර්බයින භාවිතයෙන් උත්පාදනය කළ හැකි විදුලිය ප්‍රමාණය ගිගාවොට් 27ක් පමණ වන බව හඳුනාගෙන තිබෙනවා. මුහුදු ජලය මත පාවෙන සුළං ටර්බයින පාවිච්චියට ගෙන ගිගාවොට් 29ක් පමණ උත්පාදනය කර ගත හැකි බව අනාවරණය වෙනවා.



ප්‍රශ්නය: මෙරටට බලපාන මුළු සුළං විභවය ම භාවිතයට ගතහොත් එමඟින් මෙරටට අවශ්‍ය විදුලිය ප්‍රමාණය උත්පාදනය කරගත හැකි ද?.

පිළිතුර: ඉහත සඳහන් කළ සියලුම සුළං විභවයන් පාවිච්චියට ගතහොත් අපට අවශ්‍ය විදුලිය ප්‍රමාණයටත් වඩා වැඩියෙන් නිපදවා ගන්න හැකි වෙනවා. ඇත්තටම මුළු විභවයම ප්‍රයෝජනයට ගන්න හැකියාවක් ලැබුණොත් ඉල්ලුමට වඩා වැඩියෙන් විදුලිය නිෂ්පාදනය කෙරෙයි කියලා කියන්න පුළුවන්. නමුත් මුළු විභවයම භාවිතයට ගන්න බැහැ. ඊට බලපාන නොයෙකුත් ගැටලු තියෙනවා.

ප්‍රශ්නය: අක්වෙරළ සුළං බලය මුළුමනින්ම භාවිත කිරීමට සැලසුම් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ භාවිතය සඳහා පමණක් ද?.

පිළිතුර: නැහැ; නිෂ්පාදනය කෙරෙන බලශක්තිය සඳහා රට තුළ ඉල්ලුම අඩුනම් අතිරික්තය අලෙවි කරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් යෝජනාවක් තිබුණා. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දේශ සීමා හරහා විදුලිබල ජාල සම්බන්ධ කල යුතු බවටත් කරුණු මතු වුණා. එහි අදහස ශ්‍රී ලංකාව නිෂ්පාදනය කරන අක්වෙරළ සුළං බලයේ අතිරික්තය ඉන්දියාවට අලෙවි කිරීම. මෙයට පෙර ඒ සම්බන්ධයෙන් දෙරට අතර සාකච්ඡාත් පැවැත් වුණා.

ප්‍රශ්නය: මෙරට සුළං විභවය වඩාත් ඉහළ මට්ටමක තිබෙන ස්ථාන මුල් කරගෙන මෙයට පෙර සුළං විදුලි බලාගාර ඉදි කෙරුණා. මේ වනවිට ඒවා ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනව ද?.

පිළිතුර: ඔව්; ඒවා පෞද්ගලික අංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන්නෙ. එම බලාගාර ක්‍රියාත්මක මට්ටමේ පවතිනවා.

ප්‍රශ්නය: අපේ රටේ කඳුකර ප්‍රදේශවල හොඳ සුළං විභවයක් තිබෙනවා නේද?.

පිළිතුර: ඇත්ත වශයෙන්ම ඔව්; කඳුකර ප්‍රදේශ මුල් කරගෙන ඉදි කෙරුණු සුළං බලාගාර කිහිපයකුත් තිබෙනවා. අඹේවෙල තිබෙන සුළං බලාගාරය එකක්. ඒ හැරුණම රත්නපුර දිස්ත්‍රික්කයේ විල්පිට සුළං බලාගාරයත් නිදසුනක්. කඳුකරයේ තිබෙන සුළං විභවය ප්‍රයෝජනයට ගන්න බැරි වී තිබෙන්නේ ප්‍රවාහන ගැටලු හා ඒවා ඉදිකිරීමට ඇති අභියෝග නිසාය. විදේශ රටවල් නම් එවැනි ස්ථානයක ඉදි කෙරෙන සුළං බලාගාරයකට අවශ්‍ය භාණ්ඩ රැගෙන යන්න භාණ්ඩ ප්‍රවාහන හෙලිකොප්ටර භාවිතයට ගන්නවා. අපේ රටේ එවැනි ක්‍රම භාවිත කළහොත් පිරිවැය වියදම වැඩි වී තරගකාරී මිලකට විදුලිය ලබාදීමට නොහැකි වෙනවා. එය ගැටලුවක්. ඊට වඩා පහසුවෙන් වෙරළ තීරයේ සුළං බලය භාවිතයට ගන්න පුළුවන්.

▸ සංවාද සටහන මංජුලා විජයරත්න



නියමු ව්‍යාපෘතිවල සිට ජාතික පාවෙන සූර්ය බලශක්ති වැඩසටහනක් දක්වා වූ ගමන

ජාතික පාවෙන සූර්යය බලශක්ති වැඩසටහනක් මෙරට තුළ මේ වනවිට ක්‍රියාත්මක ය. එමඟින් කෙරෙන්නේ ජලාශ මත පාවෙන සූර්යය පැනල සවි කර, ඉන් උත්පාදනය වන බලශක්තිය ජාතික පද්ධතියට මුදාහැරීමයි. පාවෙන සූර්යය බල පද්ධති භාවිතයෙන් බලශක්තිය උත්පාදනය ශ්‍රී ලංකාවට නවමු අත්දැකීමක් සේ පෙනී යන නමුත් එය මෙයට පෙර අවස්ථා කිහිපයකදී අත්විඳි අත්දැකීමක් බව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශයේ ඉංජිනේරු දිනේෂ් ප්‍රියදර්ශන මහතා සඳහන් කරයි. ඒ මහතා එසේ සඳහන් කළේ "සංරක්ෂා" සඟරාව සඳහා සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමිනි.

ප්‍රශ්නය: ශ්‍රී ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රය ඉතා වේගයෙන් පුනර්ජනනීය බලශක්ති භාවිතය වෙත මේ වනවිට යොමුවෙමින් තිබෙනවා කිව්වොත් නිවැරදි ද?.

පිළිතුර: ඇත්තටම එය නිවැරදියි. එවැනි වේගවත් හැරවුමක් මේ වන විට දකින්න පුළුවන්.

ප්‍රශ්නය: එවැනි හැරවුමක් මෙරට බලශක්ති ක්ෂේත්‍රයට අවශ්‍ය ඇයි?.

පිළිතුර: ඒ සඳහා කරුණු ගණනාවක් බලපා තිබෙනවා. රටේ විදුලි ඉල්ලුම අඛණ්ඩව වර්ධනය වීම එක කරුණක්. ඒ හැරුණම සීමිත භූමි සම්පත්, බලශක්ති ආරක්ෂාව, ආනයනික ඉන්ධන මත යැපීම අවම කිරීම සහ දේශගුණික විපර්යාසවල බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම යන කරුණු තවත් පැත්තකින් බලපානවා. ඒ නිසා අපේ රට පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට වැඩි අවධානයක් යොමු කර තිබෙනවා යැයි කියන්න පුළුවන්. ඒක මෙරට බලශක්ති ක්ෂේත්‍රයේ හැරවුමක්.

ප්‍රශ්නය: ඒ අනුව ඉදිරි ඉලක්කය කුමක් ද?.

පිළිතුර: 2026 වසරේදී රජය විසින් අනුමත කරන ලද පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2025 2030 මඟින් 2030 වන විට ජාතික විදුලි උත්පාදනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලින් ලබා ගැනීම ඉලක්ක කර තිබෙනවා.

ප්‍රශ්නය: මෙරට වෙසෙන ජනයාට අත්විඳින්න නොලැබුණු පාවෙන සූර්යය බලාගාරවලින් බලශක්තිය උත්පාදනය කර ගැනීම පිළිබඳවත් මේ සැලසුමේ සඳහන් වෙනවා නේද?.

පිළිතුර: ඔව්; එම සැලැස්මට පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතිත් ඇතුළත් කර තිබෙනවා. එමඟින් පැහැදිලි කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ බලශක්ති සංවර්ධන ප්‍රතිපත්තිය, පාවෙන සූර්යය බලාගාර (Floating Solar Photovoltaic - කෙටියෙන් දැක්වුවහොත් FPV) තාක්ෂණයට ලබා දී තිබෙන වැදගත්කම පිළිබඳවයි. මෙම පසුබිම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පවතින විශාල ජලාශ සහ අනෙකුත් සුදුසු ජල මතුපිට ප්‍රදේශ සූර්ය විදුලි උත්පාදනය සඳහා භාවිත කිරීම වැදගත් අවස්ථාවක් බවට පත්ව තිබෙනවා.

ප්‍රශ්නය: පාවෙන සූර්යයබල පද්ධතියක් විශයෙන් හැඳින්වෙන්නේ කුමක් ද?.

පිළිතුර: පාවෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති (Floating Solar Photovoltaic - FPV) යනුවෙන්

හැඳින්වෙන්නේ ජලාශයක හෝ වෙනත් සුදුසු ජල මතුපිටක විශේෂයෙන් සැලසුම් කරන ලද පාවෙන ව්‍යුහ මත සූර්ය පැනල ස්ථාපනය කර විදුලිය උත්පාදනය කරන තාක්ෂණයක්. පාවෙන සූර්ය බලශක්තිය යනු හුදෙක් ජලාශයක් මත සූර්ය පැනල ස්ථාපනය කිරීමක් ම නොවන වගත් අප වටහා ගතයුතුයි. සාර්ථක ව්‍යාපෘතියක් සඳහා ජල සම්පත් කළමනාකරණය, පාරිසරික ආරක්ෂාව, ප්‍රජා අවශ්‍යතා, ඉංජිනේරු සැලසුම්, විදුලිබල ජාල ධාරිතාව, මූල්‍ය ශක්‍යතාව සහ දිගුකාලීන මෙහෙයුම් යන සියලු කරුණු ඒකාබද්ධව සලකා බැලිය යුතුයි.

පාවෙන සූර්යයබල පද්ධති ඉදි කිරීම මෙරටට හඳුන්වාදෙන නව සූර්ය බලශක්ති තාක්ෂණයක් පමණක් නොවෙයි. සීමිත භූමි සම්පත් සඳහා ඇති පීඩනය අවම කරමින් පවතින ජල සම්පත් සහ විදුලිබල යටිතල පහසුකම් වඩාත් කාර්යක්ෂමව භාවිත කිරීමට හැකි උපායමාර්ගික විකල්පයක් හැටියටත් හඳුන්වන්න පුළුවන්.

ප්‍රශ්නය: පාවෙන සූර්යය බල පද්ධති තාක්ෂණය මෙරටට කෙතෙක් දුරට ගැළපෙයි ද?.

පිළිතුර: ඔව්, එය වැදගත් ප්‍රශ්නයක්. ශ්‍රී ලංකාව සතුව දිවයින පුරා විහිදුණු විශාල ජලාශ සහ වාරි ජල ටැංකි පද්ධතියක් තිබෙනවා. ඒ වගේම හොඳ සූර්ය බලශක්ති සම්පතක් සහ දැනටමත් පවතින ජල විදුලි හා විදුලි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් මෙරට පවතිනවා. සූර්යය පැනල සවිකෙරෙන්නේ මෙරට ජලාශ හෝ වාරි ජල ටැංකිවලින් සමහරක. එය මෙරට බලශක්ති ක්ෂේත්‍රයට තරමක අලුත් අත්දැකීමක්. එනිසා පාවෙන සූර්ය බල පද්ධති තාක්ෂණය රටට විශේෂයෙන් වැදගත් තාක්ෂණයක් බවට පත්වෙන්න ඉඩ තිබෙනවා. භූමි සම්පත් සඳහා ඇති තරගය අවම කරමින් පිරිසිදු (පොසිල ඉන්ධන දහනයකින් තොරව) විදුලිබල නිෂ්පාදනය පුළුල් කිරීමට අවස්ථාව සැලසෙනවා.

ප්‍රශ්නය: ඒ අනුව අනාගතයේදී මෙරට ජලාශ හුදෙක් ජල ගබඩාකරණය සඳහා පමණක් සීමා වෙන්නෙ නැහැ නේද?.

පිළිතුර: ඔව්; අනාගතයේදී ශ්‍රී ලංකාවේ ජලාශ ජල ගබඩා කිරීම සඳහා පමණක් නොව, පිරිසිදු විදුලිය උත්පාදනය, ජල සම්පත් කළමනාකරණය සහ බලශක්ති ගබඩා කිරීම ඒකාබද්ධ කරන බහුකාර්ය බලශක්ති වත්කම් බවට පත් වනු නියතයි.



ප්‍රශ්නය: කිරිඉබ්බන් වැව, චන්ද්‍රිකා වැව ආදී ස්ථාන කිහිපයක මෙයට පෙර අවස්ථාවකදී පාවෙන සූර්යය බලාගාර ඉදිකළා නේද?.

පිළිතුර: ඔව්; ශ්‍රී ලංකාවේ දේශගුණික සහ මෙහෙයුම් තත්ත්වයන් යටතේ මෙම තාක්ෂණයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහායි, එම කුඩා පරිමාණ නිරූපණ හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ. ඒ අතරින් කිලිනොච්චි ප්‍රදේශයේ පිහිටි යාපනය විශ්වවිද්‍යාලයේ කිලිනොච්චි පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද කිලෝවොට් 46කට ආසන්න පාවෙන සූර්ය බලශක්ති පද්ධතිය විශේෂයි. ශ්‍රී ලංකාවේ පාරිසරික හා දේශගුණික තත්ත්වයන් යටතේ පාවෙන සූර්ය බලශක්ති තාක්ෂණයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීමටත්, එය භූමිය මත ස්ථාපනය කරන සාම්ප්‍රදායික සූර්ය බලශක්ති පද්ධති සමග සංසන්දනය කිරීමටත් අවස්ථාව ලැබුණේ එමඟින්. ඉන් පසුවයි; ශ්‍රී ලංකාවේ පාවෙන සූර්ය බලශක්ති සංවර්ධනයේ වැදගත් සන්ධිස්ථානයක් වූ චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව ආශ්‍රිතව මෙගාවොට් 1 බැගින් වූ පාවෙන සූර්ය බලශක්ති නියමු ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කෙරුණෙ. ඒ අනුව, පාවෙන සූර්ය බලශක්ති තාක්ෂණය මේ අවස්ථාවේදීම ක්‍රියාත්මක කෙරෙන, ශ්‍රී ලංකාවට සම්පූර්ණයෙන්ම අලුත් සංකල්පයක් ම නොවෙයි. මෙහිදී විශේෂයෙන් මතක් කළයුතු වන්නෙ මෙම ව්‍යාපෘති දෙක මඟින්, කුඩා පරිමාණ පර්යේෂණ හා නිරූපණ ව්‍යාපෘතිවල සිට ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කළ හැකි උපයෝගිතා මට්ටමේ පාවෙන සූර්ය ව්‍යාපෘති දක්වා ගමන් කිරීමට ශ්‍රී ලංකාවට හැකි වූ බවයි.

ප්‍රශ්නය: චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව ආශ්‍රිත නියමු පාවෙන සූර්යය බල පද්ධති දෙක ක්‍රියාත්මක කෙරුණෙ කවර කාලයේදී ද?.

පිළිතුර: කොරියානු රාජ්‍යයේ සහයෝගය මත මෙම නියමු ව්‍යාපෘති දෙක 2024 වසරේ නොවැම්බර් 27 වන දින විවෘත කළා.

ප්‍රශ්නය: එම නියමු ව්‍යාපෘති දෙක නිසා පාවෙන සූර්යය බලාගාර පිළිබඳව අත්දැකීම් විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වූ බව ද ඔබ සඳහන් කරන්නේ?.

පිළිතුර: ඔව්; එම නියමු ව්‍යාපෘතිවල වැදගත්කම ඒවායේ ස්ථාපිත ධාරිතාව වන මෙගාවොට් 2ට පමණක් සීමා වුණේ නැහැ . පාවෙන ව්‍යුහ, නැංගුරම් හා මූරිං පද්ධති, විදුලි උපකරණ, මෙහෙයුම් හා නඩත්තු ක්‍රමවේද, ජල මට්ටමේ වෙනස්වීම් ඒ වගේම පාරිසරික කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වැදගත් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගන්න මෙම ව්‍යාපෘති මඟින් හැකියාවක් ලැබුණා.

ප්‍රශ්නය: ශ්‍රී ලංකාවට පාවෙන සූර්ය බලශක්තිය

පාවෙන සූර්ය බලශක්තියේ ප්‍රධාන වාසිය වෙන්නෙ විශාල භූමි ප්‍රමාණයක් භාවිත නොකර විදුලිය නිපදවීමට පුළුවන් වීම. භූමිය මත ස්ථාපනය කරන සාම්ප්‍රදායික සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා සුදුසු භූමියක්, සුදුසු භූගෝලීය ලක්ෂණ, ප්‍රවේශ පහසුකම් සහ විදුලිබල ජාලයට සම්බන්ධ වීමේ හැකියාව ආදිය අවශ්‍යයයි. ජනාවාස, කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ පරිසර සංරක්ෂණය වැනි විවිධ අවශ්‍යතා සඳහා භූමිය භාවිත වන ශ්‍රී ලංකාව වැනි රටක විශාල භූමි ප්‍රමාණයක් සූර්ය බලශක්තිය සඳහා වෙන් කිරීම අභියෝගයක් වෙන්නත් පුළුවන්.



වැදගත් වන්නේ ඇයි?.

පිළිතුර: පාවෙන සූර්ය බලශක්තියේ ප්‍රධාන වාසිය වෙන්නෙ විශාල භූමි ප්‍රමාණයක් භාවිත නොකර විදුලිය නිපදවීමට පුළුවන් වීම. භූමිය මත ස්ථාපනය කරන සාම්ප්‍රදායික සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා සුදුසු භූමියක්, සුදුසු භූගෝලීය ලක්ෂණ, ප්‍රවේශ පහසුකම් සහ විදුලිබල ජාලයට සම්බන්ධ වීමේ හැකියාව ආදිය අවශ්‍යයයි. ජනාවාස, කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ පරිසර සංරක්ෂණය වැනි විවිධ අවශ්‍යතා සඳහා භූමිය භාවිත වන ශ්‍රී ලංකාව වැනි රටක විශාල භූමි ප්‍රමාණයක් සූර්ය බලශක්තිය සඳහා වෙන් කිරීම අභියෝගයක් වෙන්නත් පුළුවන්. ඒ නිසා සුදුසු ජල මතුපිටක් භාවිත කිරීම වැදගත් විකල්පයක් ලෙස සැලකිය හැකි ය. ඒ හැරුණම තවත් වාසි කිහිපයක් ම තිබෙනවා.

ප්‍රශ්නය: මොනවද ඒ වාසි?

පිළිතුර: පළමුවැන්න, ජල මතුපිට කාර්යක්ෂමව භාවිත කිරීම. ඒ කියන්නෙ සුදුසු ජලාශවල ජල මතුපිට බලශක්ති නිෂ්පාදනය සඳහා යොදා ගැනීමෙන් එලදායී භූමි සම්පත් වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කිරීමට ඉඩ සැලසෙනවා කියන කාරණය. දෙවැන්න, සූර්ය පැනලවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමේ හැකියාව. ඒ කියන්නෙ ජලය ආසන්නයේ පාවෙන සූර්ය පැනල ස්ථාපනය කිරීම මඟින් පද්ධතියේ මෙහෙයුම් උෂ්ණත්වය අඩු වෙන්න පුළුවන් කියන කාරණයයි. ඒ හේතුවෙන් සූර්ය පැනලවල විදුලි කාර්යක්ෂමතාව සහ බලශක්ති නිෂ්පාදනය වැඩි වීමේ හැකියාවක් පවතිනවා. තෙවැන්න, භූමි භාවිතය සම්බන්ධ ගැටුම් අවම කිරීම. පාවෙන සූර්ය ව්‍යාපෘති මඟින් කෘෂිකාර්මික භූමි, ජනාවාස සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය භූමි භාවිතය සමග ඇති විය හැකි ගැටුම් අවම කිරීමට හැකියාව තිබෙනවා කියන එකයි; එහි අරුත. සිව් වැන්න, ජල වාෂ්පීභවනය අඩු කිරීමේ හැකියාව. ජලාශ මතුපිට කොටසක් සූර්ය පැනල මඟින් ආවරණය වන නිසා සෘජු සූර්ය විකිරණය සහ සුළං බලපෑම අඩු විය හැකි ය. ආවරණය කරන ලද ප්‍රදේශයේ ජල වාෂ්පීභවනය අඩු වීමේ හැකියාවක් පවතිනවා. කොහොම වුණත්, මෙහි ප්‍රතිලාභය ජලාශයේ ස්වභාවය, දේශගුණික තත්ත්ව, ආවරණ ප්‍රතිශතය සහ පාවෙන පද්ධතියේ සැලසුම වැනි කරුණු අනුව වෙනස් වෙන්න පුළුවන්. පස් වැන්න, පවතින විදුලිබල යටිතල පහසුකම් භාවිත කිරීමේ හැකියාව. සුදුසු ජලාශ, විදුලිබල සම්ප්‍රේෂණ හෝ බෙදාහැරීමේ යටිතල පහසුකම් ආසන්නයේ පිහිටා ඇත්නම්, අවශ්‍ය ජාල අධ්‍යයන සහ ධාරිතා තහවුරු කිරීම්වලට යටත්ව, පවතින විදුලිබල යටිතල පහසුකම් භාවිත කිරීමට අවස්ථාව ලැබිය හැකි යන්නයි එහි අදහස.

ප්‍රශ්නය: නියමු ව්‍යාපෘතිවලින් ලබාගත් අත්දැකීම් සමග ශ්‍රී ලංකාව පාවෙන සූර්යය බලාගාර සංවර්ධනය මහා පරිමාණ මට්ටමට රැගෙන එන්නට සැලසුම් කරන බව ඔබ පැහැදිලිව ම සඳහන් කරනවා ද?.

පිළිතුර: ඇත්ත වශයෙන් ම ඔව්; නියමු ව්‍යාපෘතිවලින් ලබාගත් අත්දැකීම් සමග ශ්‍රී ලංකාවේ පාවෙන සූර්ය බලශක්ති සංවර්ධනය ක්‍රමයෙන් මහා පරිමාණ සහ වඩාත් ක්‍රමවත් ව්‍යාපෘති සංවර්ධනයක් කරා ගමන් කරමින් තිබෙන බව කියන්නම ඕනෙ. මෙම අදියරේදී සුදුසු ජලාශ හඳුනා ගැනීම පමණක් ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. සෑම ව්‍යාපෘතියක්ම තාක්ෂණික, ආර්ථික, පාරිසරික, සමාජීය සහ විදුලිබල ජාල සම්බන්ධතා යන සියලුම අංශ ආවරණය වන පරිදි සවිස්තරාත්මකව අධ්‍යයනය කළ යුතුයි. මෙම ක්‍රමවේදය මඟින් සුදුසු නොවන ව්‍යාපෘති මුල් අදියරේදීම හඳුනාගෙන ඉවත් කිරීමටත්, තාක්ෂණිකව, පාරිසරිකව සහ ආර්ථිකව ශක්‍යතා ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමටත් හැකියාව ලැබෙනවා.

ප්‍රශ්නය: පාවෙන සූර්යයබල පද්ධති ඉදි කිරීමට සුදුසු විභවයන් සහිත මෙරට තවත් ජලාශ මේ වනවිට හඳුනාගෙන තිබෙනවා ද?.

පිළිතුර: ඔව්; එවැනි ජලාශ රැසක් මේ වනවිට හඳුනාගෙන තිබෙනවා.

ප්‍රශ්නය: මෙරට දැකිය හැකි කවර ජලාශවල පාවෙන සූර්යයබල පද්ධති අනාගතයේදී ඉදි කෙරෙනු ඇති ද?.

පිළිතුර: ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම්වලට අනුව මෙගාවොට් 70ක පාවෙන සූර්යය බල පද්ධතියක් රන්දෙනිගල ජලාශයේ ඉදි කෙරෙනු ඇති. ඒ හැරුණම, අඹන් ඔයේ මෙගාවොට් 50ක ද, ඉරක්කාමම්හි මෙගාවොට් 50ක ද, කාසල්රීහි මෙගාවොට් 50ක ද, මීගමුව කලපුවේ මෙගාවොට් 50ක ද, දැදුරු ඔයේ මෙගාවොට් 100ක ද, රිදියගම මෙගාවොට් 50ක ද, කළු ගඟේ මෙගාවොට් 50ක ද, චන්ද්‍රිකා වැවේ මෙගාවොට් 50ක ද, කිරිඉබ්බන් වැවේ මෙගාවොට් 50ක ද පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති ඉදි කිරීම සඳහා විභවයන් පවතින බව හඳුනාගෙන තිබෙනවා. මෙම සංඛ්‍යාත්මක අගයන් ව්‍යාපෘතිවල අවසන් ස්ථාපිත ධාරිතාවන් ලෙස නොසැලකිය යුතු බවත්, සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන මඟින් ඒවා තහවුරු කළ යුතු බවත් සඳහන් කරන්න කැමතියි.

ප්‍රශ්නය: ඔබ සඳහන් කරන්නේ ජලාශයක මුළු මතුපිටම පාවෙන සූර්යය බලාගාර ඉදිකිරීම සඳහා භාවිතයට ගත යුතු බව ද?.

පිළිතුර: නැහැ; වාරිමාර්ග, ජල සැපයුම, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා ඉදිකර ඇති විශාල ජලාශ ජාලයක් මෙරට අභ්‍යන්තරයේ පවතිනවා. මෙම ජලාශවල සැලකිය යුතු ජල මතුපිට ප්‍රමාණයක් සුදුසු සැලසුම් සහ පාරිසරික ආරක්ෂණ ක්‍රමවේද යටතේ පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා භාවිත කිරීම යෝග්‍යයයි. ජලාශයක සම්පූර්ණ ජල මතුපිට ප්‍රදේශය සූර්ය පැනලවලින් ආවරණය කිරීම අරමුණ නොවිය යුතුයි. සුදුසු ජල මතුපිටක කිසියම් ප්‍රතිශතයක් පමණක් භාවිත කරමින් ජල සම්පත්, පරිසර පද්ධති සහ අනෙකුත් ජල භාවිතයන් ආරක්ෂා කිරීම කළ යුතුයි.

ප්‍රශ්නය: පාවෙන සූර්යය බලාගාර මෙරට ඉදි කිරීමේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඉටු කරන්නෙ කවර ආකාරයේ කාර්යයක් ද?.

පිළිතුර: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය කිරීමේදී ඉතා වැදගත් කාර්යයක් ඉටු කරන ආයතනයක්. පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම වැනි ආයතනයක මැදිහත් වීමෙන් පමණක් සම්පූර්ණ කළ නොහැකියි. ජලාශ කළමනාකරණ ආයතන, වාරිමාර්ග අංශය, ජාතික විදුලිබල පද්ධති ක්‍රියාකරු, පාරිසරික ආයතන, ප්‍රාදේශීය ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර සමීප සම්බන්ධීකරණයක් වී සඳහා අවශ්‍යයි. එහිදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිදු කරන කාර්යය හුදෙක් සුදුසු ජල මූලාශ්‍ර හඳුනා ගැනීමට පමණක් සීමා වෙන්නෙ නැහැ. සම්පත් ඇගයීම, ස්ථාන හඳුනාගැනීම, පූර්ව අධ්‍යයන හා ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම, පාරිසරික බලපෑම් ඇගයීම සඳහා පහසුකම් සැලසීම, අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය සහ ව්‍යාපෘති, ආයෝජන කිරීමට සූදානම් මට්ටමකට ගෙන වීම දක්වා වූ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මැදිහත් වෙනවා.

ප්‍රශ්නය: පාවෙන සූර්ය බලශක්ති පද්ධති ඉදි කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය කවරාකාර ද?.

පිළිතුර: ඒ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ උනන්දුවත් ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබෙන බව කිවයුතුමයි. 2026 වසරේදී දඹුලු ඔය ජලාශයේ මෙගාවොට් 5ක පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම, රජය විසින් මෙහෙයවන ලද නියමු ව්‍යාපෘතිවලින් ඔබ්බට ගොස් පාවෙන සූර්ය බලශක්තිය වාණිජ මට්ටමට ගමන් කිරීමේ සලකුණක් ලෙස සලකන්න පුළුවන්. දිගුකාලීනව තිරසර පාවෙන සූර්ය බලශක්ති කර්මාන්තයක් ගොඩනැඟීම සඳහා ව්‍යාපෘති සංවර්ධකයන්, ආයෝජකයන්, ඉංජිනේරු සමාගම්, තාක්ෂණික සැපයුම්කරුවන්, මූල්‍ය ආයතන සහ දේශීය සේවා සපයන්නන්ගේ සහභාගීත්වය අවශ්‍ය වෙනවා.

▸ සංවාද සටහන මංජුලා විජයරත්න



ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම්වලට අනුව මෙගාවොට් 70ක පාවෙන සූර්යය බල පද්ධතියක් රන්දෙනිගල ජලාශයේ ඉදි කෙරෙනු ඇති. ඒ හැරුණම, අඹන් ඔයේ මෙගාවොට් 50ක ද, ඉරක්කාමම්හි මෙගාවොට් 50ක ද, කාසල්රීහි මෙගාවොට් 50ක ද, මීගමුව කලපුවේ මෙගාවොට් 50ක ද, දැදුරු ඔයේ මෙගාවොට් 100ක ද, රිදියගම මෙගාවොට් 50ක ද, කළු ගඟේ මෙගාවොට් 50ක ද, චන්ද්‍රිකා වැවේ මෙගාවොට් 50ක ද, කිරිඉබ්බන් වැවේ මෙගාවොට් 50ක ද පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති ඉදි කිරීම සඳහා විභවයන් පවතින බව හඳුනාගෙන තිබෙනවා.



ගලා යන ජල ධාරාවන්ට ඉහළින් සූර්යය පැනල සවි කිරීම

ඇළ මාර්ගයක් වැනි ජල තලයට ඉහළින් සූර්යය පැනල රඳවා එමඟින් සූර්යය බලය උත්පාදනය කිරීමේ තාක්ෂණය ශ්‍රී ලංකාවට තවමත් අලුත් තාක්ෂණයකි. එසේ වුවත් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගණයේ වියානා ඇළ කේන්ද්‍ර කරගෙන එවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මේ වනවිට කටයුතු සංවිධානය කෙරෙමින් තිබෙන බව සඳහන් වේ. ඊට අදාළ අධ්‍යයන කටයුතු ද දැනට සිදු කෙරෙමින් ඇත.

වැව්, ජලාශ ආදිය පාදක කරගෙන පාවෙන සූර්යය බලාගාර මේ වනවිට ඉදි කර ඇත. එවැනි බලාගාර ශ්‍රී ලංකාවේ ද දක්නට ලැබෙයි. එසේ වුවත් ඇළ මාර්ග කේන්ද්‍ර කරගෙන සූර්යය බලාගාර ඉදි කෙරෙන්නේ එයට වඩා වෙනස් ආකාරයෙනි. එහිදී සූර්යය පැනල ජලය මත පාවීමක් සිදු වන්නේ නැත. ඇළ මාර්ගයේ ජල පෘෂ්ඨයට ඉහළින් සූර්යය පැනල රැඳවීමක් එහිදී සිදු කෙරේ. ඇළ මාර්ගයක ජල පෘෂ්ඨය ආවරණය කරමින් ඒ ආකාරයට සූර්යය පැනල රඳවා සූර්යය බලය උත්පාදනය කෙරෙන ව්‍යාපෘති ලොව වෙනත් රටවල දක්නට ලැබෙයි. එවැනි සමහර ව්‍යාපෘති සඳහා යොදාගෙන තිබෙන්නේ ඇළ මාර්ග නොව සෑහෙන ජල කඳක් රැගෙන ගලා බසින ගංගාවල ශාඛාවන් ය. ගංගා හෝ ඇළ මාර්ග ආවරණය කරමින් ඉදි කෙරුණු සූර්යය බලාගාර අද්‍යටත් ලෝ පුරා සුලභ නැත. පහත සඳහන් වන්නේ ගලා යන ජල ප්‍රවාහ කේන්ද්‍ර කරගෙන ඒ අන්දමට ඉදි කරන ලද ව්‍යාපෘති කිහිපයක් පිළිබඳ විස්තරයකි.

1. ඉන්දියාවේ මහ්සනා දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද බලාගාරය

ඉන්දියාවේ ගුජරාත් ප්‍රාන්තයේ මහ්සනා දිස්ත්‍රික්කයේ ගලා බසින ජල ධාරාවක ජල පෘෂ්ඨයට ඉහළින් සූර්යය පැනල රඳවා එමඟින් සූර්යය බල උත්පාදනය කිරීම 2012 වසරේ අප්‍රේල් 24 වැනි දින සිදු කෙරිණ. ජල පෘෂ්ඨයකට ඉහළින් සූර්යය පැනල රඳවා සූර්යය බල උත්පාදනය කළ ලොව පළමු අවස්ථාව ලෙස එය ඉතිහාස ගත වී තිබේ. ඒ සඳහා මුල් වූයේ ඉන්දියාවේ ප්‍රකට ගංගාවක් වන නර්මදා නදිය පෝෂණය කරන ශාඛා ජල ධාරාවකි. එය චන්ද්‍රසන් නම් දුෂ්කර ගම්මානය පසුකර ගලා බසින ජල ධාරාවක් බව සඳහන් වේ. ආරම්භක අවස්ථාවේදී සූර්යය බලාගාරය ඉදි කෙරුණේ ජල දහරාවෙන් මීටර 750ක් පමණ දිගක් ආවරණය කරමිනි. මුල් අදියරේදී එමඟින් නිෂ්පාදනය කෙරුණේ මෙගාවොට් එකක ධාරිතාවක් පමණි. වසරකට කිලෝවොට් පැය මිලියන 1.6ක ධාරිතාවක් උත්පාදනය කළ හැකි වනු ඇතැයි ආරම්භයේදී ඇස්තමේන්තු කර තිබිණ.

ඒ අන්දමට ආරම්භ කෙරුණු ව්‍යාපෘතිය පසු කලෙක පුළුල් කෙරිණ. අද එය මහා පරිමාණයෙන් සූර්යය බලය උත්පාදනය කරන බලාගාරයක් බවට පත්ව තිබේ. එම ව්‍යාපෘතිය හැඳින්වෙන්නේ ඇළ මාර්ග ආශ්‍රිත සූර්යය බල ව්‍යාපෘතිය (Canal Solar Power Project) යනුවෙනි. ඒ සඳහා මුල් වී තිබෙන්නේ මතු සඳහන් කළාක් මෙන් නර්මදා නදියේ ශාඛා ජල මාර්ගයක ජලයයි. එහි කිලෝ මීටර 532ක් ආවරණය කරමින් සූර්යය පැනල රඳවමින් විදුලිය උත්පාදනය කෙරෙන බව සඳහන් වේ.

ගලා යන ජල ධාරාවක් ආවරණය කරමින් ඉදි කෙරුණු එකී පළමු ව්‍යාපෘතියෙන් ලත් අත්දැකීම් පාදක කරගෙන තවත් එවැනි ව්‍යාපෘති කිහිපයක් ඉන්දීය බලධාරීහු ආරම්භ කළහ.

2. ඉන්දියාවේ වදෝදරාහි සූර්ය බල ව්‍යාපෘති (Solar plants in Vadodara)

මෙම ව්‍යාපෘතිය සඳහා මුල් වන්නේ ද ඉන්දියාවේ ගුජරාත් ප්‍රාන්තයයි. ව්‍යාපෘතියට භාවිත කෙරී තිබෙන්නේ

නර්මදා නදියට සම්බන්ධ වදෝදරා ඇළ මාර්ගයයි. ඇළ මාර්ගය ඔස්සේ කිලෝමීටර 3.6ක් දුරට බලාගාරය ඉදි කර ඇත. එමඟින් මෙගාවොට් 10ක පමණ ධාරිතාවක් උත්පාදනය කෙරේ.



3. ඉන්දියාවේ පන්ජාබ් සින්ධ්වාන් ඇළ මාර්ගය ආශ්‍රිත සූර්යය බල ව්‍යාපෘතිය (Punjab Sidhwan Canal solar project)

ඇළ මාර්ගය ඔස්සේ කිලෝ මීටර 1.25ක් දුරට සූර්යය පැනල සවි කිරීමට ඉන්දීය බලශක්ති ක්ෂේත්‍රයේ බලධාරීහු පසුගිය වසරවලදී සමත් වූහ. එම දුර ප්‍රමාණය ආවරණය කරමින් සූර්යය පැනල 8,421ක් පමණ සවි කරන ලද බව සඳහන් වේ. ආරම්භක අදියරේදී එමඟින් උත්පාදනය කෙරුණේ මෙගාවොට් 2.5ක පමණ ධාරිතාවකි. පසුව මෙම ව්‍යාපෘතිය තවදුරත් පුළුල් කෙරුණු බව සඳහන් වේ.

4. ඇමෙරිකාවේ නෙක්සස් ව්‍යාපෘතිය (Project Nexus)

ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝර්නියාහි ඇළ මාර්ගයක් කේන්ද්‍ර කරගෙන මෙම සූර්යය බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. බලාගාරයේ ඉදි කිරීම් කටයුතු 2024 වසරේදී ආරම්භ කෙරිණ. ඇමෙරිකා ඩොලර් මිලියන 20ක පමණ රජයේ අරමුදල් යොදවා ඉදි කරන ලද මෙම බලාගාරයෙන් ජනනය කෙරෙන විදුලිය සම්බන්ධයෙන් බලශක්ති විශේෂඥයෝ විවිධ අධ්‍යයනයන් සිදු කරමින් සිටිති. මෙම ව්‍යාපෘතිය සාර්ථක තත්ත්වයක පවතී නම් කැලිෆෝර්නියාවේ තිබෙන ගලායන ජලධාරා විශාල සංඛ්‍යාවක් පාදක කරගනිමින් ඒ ආකාරයෙන් විදුලිය උත්පාදනය කිරීමට ඔවුහු සැලසුම් කරති. අඩු තරමින් ගලායන ජල මාර්ග සැතපුම් 4 000ක් පමණ පාදක කරගෙන මෙවැනි බලාගාර ඉදි කළ හැකි බව බලශක්ති විශේෂඥයන්ගේ මතයයි.

ගලා යන ජල ධාරාවල ජල පෘෂ්ඨය ආවරණය කරමින් සූර්යය පැනල සවි කර එයින් විදුලිය උත්පාදනය කරගැනීමේ ක්‍රියාවලියේදී තවත් වාසි රාශියක් අත්වන බව පර්යේෂණවලින් මේ වනවිට අනාවරණය වී තිබේ. ඒ අතර වඩාත් වැදගත්ම වාසිය වන්නේ බලාගාර ඉදි කිරීම සඳහා විශේෂයෙන් ම ඉඩම් වෙන් කිරීමට සිදු නොවීමයි. මේ නිසා ජනගහනය අධික රටවලට මෙය වඩාත් උචිත පුනර්ජනනී බලශක්ති උත්පාදන ක්‍රමයක් බව විද්‍යාඥයෝ පෙන්වා දෙති. ඒ හැරුණු විට ජල මාර්ගවලින් වාෂ්ප වී යන ජල ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා මෙම තාක්ෂණය ඉවහල් වන බව අනාවරණය වී ඇත. ඉන්දියාවේ මහාසනා දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද සූර්යය බලාගාරය මෙගාවොට් එකක ධාරිතාවක් උත්පාදනය කරන ලද මුල් කාලයේදී පවා ජලය වාෂ්ප වී යෑම විශාල වශයෙන් පහළ වැටී තිබුණු බව තහවුරු වී තිබේ. එම ප්‍රමාණය වසරකට ජලය ලීටර 9 000 000ක් පමණ වූ බව විද්‍යාඥයෝ පෙන්වා දෙති. කෘෂිකාර්මික කටයුතු සඳහා සහ පානීය අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් තරම් ජලය නොමැති රටවල ජනයාට එනිසා මේ තාක්ෂණය වාසි සහගත බව පෙනීයයි. ජල සුරක්ෂිතතාව ඇති කිරීම සහ පිවිතුරු විදුලිය උත්පාදනය කිරීම වත්මන් ලෝකය හමුවේ ඇති බරපතළ ගැටලු දෙකකි. ගලා යන ජල ධාරාවන්ට ඉහළින් සූර්යය පැනල රඳවා එමඟින් විදුලිය උත්පාදනය කිරීමෙන් එම බරපතළ ගැටලු දෙක සඳහාම විසඳුම් අත්වන බව මේ අනුව තහවුරු වේ.

ගලා යන ජල පෘෂ්ඨයට ඉහළින් සූර්යය පැනල රඳවන නිසා ජල පෘෂ්ඨය වෙත සෘජුව ලැබෙන සූර්යාලෝකය ප්‍රමාණය බෙහෙවින් අඩු මට්ටමක පවතී. එනිසා ජලයේ ඇල්ගී විශේෂ සහ වෙනත් ජලජ වල්පැළෑටි විශේෂ වර්ධන වේගය බෙහෙවින්ම පහළ මට්ටමකට වැටෙන බව විද්‍යාඥයන්ගේ මතයයි.

එසේම ගලායන ජල පෘෂ්ඨයකට ඉහළින් සූර්යය පැනල රැඳ වූ විට එම සූර්යය පැනලවල පහළ ස්ථර නිරන්තරයෙන්ම සිසිලනය වේ. ඒ ගලා යන ජල පෘෂ්ඨයට ආසන්නයේ පැවතීම නිසයි. එය සූර්යය පැනල්වල කාර්යක්ෂමතාව ඉහළ යාමට හේතුවක් බව අනාවරණය වී ඇත. එම කාර්යක්ෂමතාව දළ වශයෙන් 7%ක් පමණ වෙතැයි විද්‍යාඥයන් ගණන් බලා තිබේ.

▸ ප්‍රභාෂනී ඉද්දමල්ගොඩ

ගලා යන ජල පෘෂ්ඨයට ඉහළින් සූර්යය පැනල රඳවන නිසා ජල පෘෂ්ඨය වෙත සෘජුව ලැබෙන සූර්යයාලෝකය ප්‍රමාණය බෙහෙවින් අඩු මට්ටමක පවතී. එනිසා ජලයේ ඇල්ගී විශේෂ සහ වෙනත් ජලජ වල් පැළෑටි විශේෂ වර්ධන වේගය බෙහෙවින්ම පහළ මට්ටමකට වැටෙන බව විද්‍යාඥයන්ගේ මතයයි.





පද්මදේව සමරනායක
තාක්ෂණික ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

සූර්ය බලශක්ති පද්ධති සහ බැටරි ගබඩා පද්ධති (BESS) සඳහා වූ නව නියාමන රාමුව

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය නව මාවතකට යොමු කරමින්, වහල මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති (RTSPV) සහ ලිතියම් බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) සඳහා වන නව නියාමන රාමුව සහ මාර්ගෝපදේශ මාලාව මෑතකදී හඳුන්වා දෙනු ලැබීය. මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL), ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) ඇතුළු පාලක ආයතන එකතුව නිකුත් කළ මෙම නව රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ තාක්ෂණික ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී මහතා සමග කළ සාකච්ඡාවකි.

ප්‍රශ්නය: මෙම නව නියාමන රාමුව සහ මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීමට මූලික වූ හේතුව කුමක්ද?

පිළිතුර: ශ්‍රී ලංකාව මේ වන විට ශීඝ්‍රයෙන් පිරිසිදු හා පුනර්ජනනීය බලශක්තිය දෙසට ගමන් කරමින් සිටිනවා. බොහෝ දෙනෙක් නිවෙස්වල සහ ව්‍යාපාරික ස්ථානවල සූර්ය පැනල (RTSPV) වගේම බැටරි පද්ධති (BESS) සවි කිරීමට යොමු වෙනවා. නමුත් මේ තාක්ෂණයන් නිසි ප්‍රමිතියකින් තොරව සවි කළහොත් විශාල විදුලි අනතුරු, ගිනිගැනීම් සහ ජාතික විදුලි බල පද්ධතියට (Grid) අස්ථාවරත්වයක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා විදුලි පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව, පද්ධතිවල ගුණාත්මකභාවය සහ විදුලි ජාලයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා තමයි මෙම නියාමන රාමුව හඳුන්වා දුන්නේ.

ප්‍රශ්නය: මෙම නව නීති On-Grid, Off-Grid සහ Hybrid යන පද්ධති සියල්ලටම අදාළ වෙනවාද?

පිළිතුර: ඔව්, නිසැකවම! මෙම නියාමන රාමුව සහ තාක්ෂණික ප්‍රමිතීන් ජාලගත (On-Grid), ජාලයෙන් බැහැර (Off-Grid) සහ මිශ්‍ර (Hybrid) යන පද්ධති වර්ග 3ටම අදාළ වෙනවා.

1. On-Grid / Grid-Connected Systems: ජාතික විදුලි ජාලයට විදුලිය සැපයීම සහ ලබාගැනීම සිදුකරන පද්ධති.
2. Off-Grid Systems: ජාතික විදුලි ජාලයට කිසිසේත්ම සම්බන්ධ නොවී තනිවම බැටරි මඟින් ක්‍රියාත්මක වන පද්ධති.
3. Hybrid Systems: ජාතික විදුලි ජාලය සහ බැටරි පද්ධතිය යන දෙකම එකට එකතු කරමින් (AC-coupled හෝ DC-coupled) ක්‍රියාකරන පද්ධති.

මේ ඕනෑම ක්‍රමවේදයකදී සවිකරන Inverters, Battery storage, Solar panels සහ wiring ක්‍රමවේද නියමිත ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල විය යුතුයි.

ප්‍රශ්නය: මෙම නව නීති සහ මාර්ගෝපදේශ මාලාව බලපාන්නේ කාටද?

පිළිතුර: මෙය ක්ෂේත්‍රයේ කොටස්කරුවන් කිහිප දෙනෙකුටම අදාළ වෙනවා:

1. පාරිභෝගිකයන් (Prosumers): On-grid, Off-grid හෝ Hybrid ක්‍රමයට සූර්ය බලශක්ති සහ බැටරි පද්ධති භාවිත කරමින් විදුලිය නිෂ්පාදනය කරන සියලුම නිවෙස් සහ ව්‍යාපාරික ස්ථාන.

2. සේවා සපයන්නන් (Solar Service Providers): මෙම පද්ධති සවිකරන, සැලසුම් කරන සහ නඩත්තු කරන කොන්ත්‍රාත්කරුවන්.

3. උපකරණ ආනයනකරුවන්: සූර්ය පැනල, Inverters (Grid-tied, Off-grid, Hybrid) සහ බැටරි ලංකාවට ආනයනය කර අලෙවි කරන ආයතන.

4. විදුලි බල බලපත්‍රලාභීන්: ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් (EDL) සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (LECO) ආයතන.


ප්‍රශ්නය: සූර්ය සහ බැටරි පද්ධති සවි කරන ආයතනවලට සහ ආනයනකරුවන්ට පනවා ඇති බලපත්‍ර කොන්දේසි මොනවාද?

පිළිතුර: On-grid, Off-grid හෝ Hybrid ඕනෑම පද්ධතියක් සවිකරන සහ උපකරණ ගෙන්වන සියලුම ආයතන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) සක්‍රීය ලියාපදිංචියක් හෝ බලපත්‍රයක් ලබාගත යුතුයි. එමෙන්ම සියලුම උපකරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI / e.g., SLS 1680) හෝ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට (IEC/ISO) අනුකූල විය යුතුයි. පද්ධතියක් සවි කළ පසු, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) ලියාපදිංචි අනුමත ලියාපදිංචි විදුලි ඉංජිනේරුවරයෙකු (Chartered Electrical Engineer) විසින් පද්ධතිය පරීක්ෂා කර සහතික කිරීම අනිවාර්ය කර තිබෙනවා.

ප්‍රශ්නය: බැටරි පද්ධතියක් (BESS) සවිකිරීමේදී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ස්ථාන සහ ආරක්ෂිත ආවරණ මොනවාද?

පිළිතුර: බැටරි පද්ධතියක් (විශේෂයෙන් Off-grid සහ Hybrid පද්ධතිවල) ආරක්ෂිතව සවිකිරීමට ස්ථානය තෝරාගැනීම ඉතාමත් තීරණාත්මකයි. නව රෙගුලාසිවලට අනුව පහත කරුණු කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයි:

- සවිකළ හැකි සුදුසු ස්ථාන: වැලිමහන් පරිශ්‍රයන්හි, ගරාජයන්හි, හොඳින් වාතාශ්‍රය ලැබෙන කොරිඩෝවල, වම උපකරණ වෙනුවෙන්ම වෙන්කළ විශේෂිත කාමර ඇතුළත හෝ වෙනම සකස් කළ ආරක්ෂිත ආවරණ (Standalone enclosures) ඇතුළත පමණක් සවිකළ යුතුය.



- ප්‍රමාණවත් වාතාශ්‍රය (Ventilation): අධික ලෙස රත්වීම සහ වායු එකතු වීම වැළැක්වීම සඳහා ස්වාභාවික හෝ යාන්ත්‍රික වාතාශ්‍රය හොඳින් ලැබෙන ස්ථානයක් විය යුතුය.

- ඉඩකඩ සහ පරතරය (Clearances): පද්ධතියේ ආරක්ෂාව, නඩත්තු කටයුතු සහ තාපය පිටවීම සඳහා නිෂ්පාදකයා විසින් නියම කර ඇති අවම හිඩැස/පරතරය තබාගත යුතුය.

- පරිසර ආරක්ෂණය සහ IP Rating: සෘජුව ජලය ඇතුළුවීම, අධික ලෙස දූවිලි එකතු වීම සහ ලුණු සුළං වැනි විඛාදන පරිසරයන්ගෙන් සුරක්ෂිත විය යුතු අතර, බැටරි මොඩියුලයේ හෝ පද්ධතිය සවිකරන ආවරණයේ ආරක්ෂිත මට්ටම අවම වශයෙන් IP54 (Ingress Protection Rating) හෝ ඊට වැඩි විය යුතුය.

ප්‍රශ්නය: සවිකිරීමෙන් පසුව පාරිභෝගිකයා විසින් පද්ධතිය භාවිත කිරීම (Operation) සහ ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යා යුත්තේ කෙසේද?

පිළිතුර: පද්ධතිය සවිකළ පසු පාරිභෝගිකයාට විශාල වගකීමක් තියෙනවා පද්ධතිය නිසි පරිදි ක්‍රියා කරවීම සහ නිරීක්ෂණය කිරීම පිළිබඳව:

- නිරන්තර දත්ත නිරීක්ෂණය (Monitoring): පද්ධතියේ වෝල්ටීයතාවය (Voltage), ධාරාව (Current), උෂ්ණත්වය (Temperature), සහ බැටරියේ ආරෝපණ මට්ටම (State of Charge SoC %) පිළිබඳව Inverter Display එකෙන් හෝ Mobile App එකෙන් නිරන්තරයෙන් නිරීක්ෂණය කළ හැකියි.

- භාවිත කළ හැකි උපරිම ධාරිතාව (Battery Capacity & Inverter Ratio): පාරිභෝගිකයා මතක තබාගත යුතුයි, බැටරියේ භාවිත කළ හැකි ධාරිතාව (kWh), ඉන්වර්ටරයේ ධාරිතාව (kW) මෙන් 5 ගුණයකට වඩා වැඩි නොවිය යුතු බව. (උදා: 5 kW ඉන්වර්ටරයකට උපරිම 25 kWh බැටරි ධාරිතාවක්).

- BMS ස්වයංක්‍රීය පාලනය: බැටරි කළමනාකරණ පද්ධතිය (BMS) මඟින් බැටරිය අධික ලෙස රත්වීමෙන්, Over-charging සහ Deep-discharging මඟින් ආරක්ෂා කරනවා. යම් හෙයකින් BMS එක මඟින් අනතුරු ඇඟවීමක් (Alarm/Fault) පෙන්නුම් කළහොත් වහාම සේවා සපයන්නා දැනුවත් කළ යුතුයි.

- හදිසි අවස්ථා සහ අක්‍රිය කිරීම (Emergency Shutdown): යම් ගිනිගැනීමක්, දුම දමීමක් හෝ වෙනත් හදිසි අනතුරක් සිදු වුවහොත්, පද්ධතියේ පිටත පැහැදිලිව සවිකර ඇති හදිසි අක්‍රිය කිරීමේ බොත්තම (ESD Button) ඔබා මුළු පද්ධතියම වහාම විදුලි ජාලයෙන් හෝ

නිවසේ පද්ධතියෙන් වෙන් කිරීමට පාරිභෝගිකයා දැනුවත් වී සිටිය යුතුය.

ප්‍රශ්නය: පාරිභෝගිකයා සහ සේවා සපයන්නා විසින් සිදු කළ යුතු නඩත්තු (Maintenance) කටයුතු සහ පරීක්ෂණ මොනවාද?

පිළිතුර: පද්ධතියක ආයු කාලය තීරණය වන්නේ නිසි නඩත්තුව මතයි. රෙගුලාසිවලට අනුව නඩත්තු කටයුතු කොටස් කිහිපයකට බෙදෙනවා:

1. වාර්ෂික පද්ධති පරීක්ෂාව (Annual Performance Verification): වසරකට වරක්වත් බලපත්‍රලාභී ශ්‍රේණියේ තාක්ෂණික ශිල්පියෙකු ලවා පද්ධතියේ සියලුම Circuit Breakers, Relays, Isolation Switches සහ ආරක්ෂණ පද්ධති පරීක්ෂා කරගත යුතුයි.

2. බැටරියේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම (Battery Health Assessment SoH): බැටරියේ ධාරිතාව අඩුවීම සහ Failing cells හඳුනා ගැනීමට වසරකට වරක් බැටරියේ State of Health (SoH) පරීක්ෂා කරගත යුතුය.

3. මෘදුකාංග සහ සොෆ්ට්වෙයාර් යාවත්කාලීන කිරීම (Firmware Updates): Inverter සහ BMS හි ඇති තාක්ෂණික දෝෂ (Bugs) නිවැරදි කර ආරක්ෂාව වැඩි කිරීමට නිෂ්පාදකයා නිකුත් කරන නවතම Firmware/Software Updates කාලීනව සිදු කළ යුතුය.

4. නඩත්තු සටහන් පොත (On-site Logbook): පද්ධතිය සවිකළ ස්ථානයේ නඩත්තු කටයුතු, පරීක්ෂා කිරීම් සහ සිදුකළ අලුත්වැඩියාවන් ඇතුළත් සටහන් පොතක් (Logbook) තබා ගැනීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) හෝ මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් සිදුකරන හදිසි නිරීක්ෂණවලදී මෙම ලොග් සටහන් පරීක්ෂා කරනු ලැබේ.

5. පරිසර සහ දූවිලි පිරිසිදු කිරීම: සූර්ය පැනල මතුපිට දූවිලි පිරිසිදු කිරීම, බැටරිය අවට වාතාශ්‍රය අවහිර වන ලෙස ද්‍රව්‍ය ගොඩගැසීමෙන් වැළකීම සහ වයරින් කවර් (Steel conduits) බිඳී ඇත්දැයි බැලීම පාරිභෝගිකයාටම තනිව කළ හැක.

ප්‍රශ්නය: ගිනි ආරක්ෂාව සහ භාවිතයෙන් ඉවත් කරන අපද්‍රව්‍ය (E-Waste) කළමනාකරණය කරන්නේ කෙසේද?

පිළිතුර: ලිතියම් බැටරි පද්ධති සඳහා කාබන් මොනොක්සයිඩ් සහ හයිඩ්‍රජන් වායු නිරීක්ෂණය කරන Sensors, සහ ස්වයංක්‍රීය ගිනි නිවන පද්ධති (Aerosol/Clean-agent) භාවිත කිරීම නියම කර තියෙනවා. එමෙන්ම භාවිතයෙන් ඉවත් කරන හෝ කාලය ඉක්මවා ගිය බැටරි සහ සූර්ය පැනල පරිසරයට හානි නොවන පරිදි මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) උපදෙස් අනුව ප්‍රතිචක්‍රීකරණය (Recycle) කිරීම හෝ බැහැර කිරීම සිදු කළ යුතුයි.

ප්‍රශ්නය: අවසාන වශයෙන්, මේ On-grid, Off-grid සහ Hybrid පද්ධති භාවිත කරන සියලුම පාරිභෝගිකයන්ට ලබාදෙන පණිවිඩය කුමක්ද?

පිළිතුර: ඔබ On-grid, Off-grid හෝ Hybrid යන කවර ක්‍රමවේදයකින් පද්ධතියක් සවි කළත්, එය ඔබේ නිවසට හෝ ව්‍යාපාරයට කරන ඉතා වටිනා දීර්ඝකාලීන ආයෝජනයක්. එම ආයෝජනයේ උපරිම ඵල නෙළා ගැනීමටත්, ඔබේ ජීවිත හා දේපළ ආරක්ෂා කරගැනීමටත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) ලියාපදිංචි සුදුසුකම් ලත් සේවා සපයන්නන් ලවා පමණක් පද්ධති සවි කරගන්න. නීතිමය හා තාක්ෂණික මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කරමින් ආරක්ෂිත හා තිරසර හරිත බලශක්ති අනාගතයකට දායක වන ලෙස මා සියලු පාරිභෝගිකයින්ගෙන් ඉල්ලා සිටිනවා.

සංවාද සටහන - නිමල්කා සමරකෝන්

ලිතියම් බැටරි පද්ධති සඳහා කාබන් මොනොක්සයිඩ් සහ හයිඩ්‍රජන් වායු නිරීක්ෂණය කරන Sensors, සහ ස්වයංක්‍රීය ගිනි නිවන පද්ධති (Aerosol/ Clean-agent) භාවිත කිරීම නියම කර තියෙනවා. එමෙන්ම භාවිතයෙන් ඉවත් කරන හෝ කාලය ඉක්මවා ගිය බැටරි සහ සූර්ය පැනල පරිසරයට හානි නොවන පරිදි මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) උපදෙස් අනුව ප්‍රතිචක්‍රීකරණය (Recycle) කිරීම හෝ බැහැර කිරීම සිදු කළ යුතුයි.





කුමාරි තෙන්නකෝන්
සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)
පුනර්ජනනීය බලශක්ති සේවා අංශය
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

දූපත් තුනකට විදුලිය සපයන
දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය

වර්තමානයේ ලෝකය මුහුණ දෙමින් සිටින ප්‍රධාන අභියෝගයක් වන්නේ බලශක්ති සුරක්ෂිතතාවයි. විශේෂයෙන්ම ලෝකයේ විවිධ ප්‍රදේශවල පවතින යුද ගැටුම් හා භූදේශපාලනික තත්ත්වයන් හේතුවෙන් පොසිල ඉන්ධනවල මිල හා සැපයුම කෙරෙහි ඇතිවන බලපෑම්, රටවල ආර්ථිකයන්ට ද සැලකිය යුතු බලපෑමක් එල්ල කරයි. මේ හේතුවෙන් ලොව පුරා රටවල් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත වැඩි අවධානයක් යොමු කරමින් බලශක්ති සුරක්ෂිතතාව සහ තිරසර සංවර්ධනය සඳහා නව විසඳුම් සොයමින් සිටී.

ශ්‍රී ලංකාව තුළද පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා දිගුකාලීනව විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේ. විශේෂයෙන්ම සූර්ය හා සුළං බලශක්තිය ඇතුළු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් උපයෝගී කර ගනිමින් රටේ බලශක්ති අවශ්‍යතාව සපුරාලීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

එවැනි වැදගත් ව්‍යාපෘතියක් ලෙස ජාතික විදුලිබල පද්ධතියෙන් වෙන්ව ක්‍රියාත්මක වන දූපත් ප්‍රදේශ සඳහා සූර්ය, සුළං, බැටරි බලශක්ති ගබඩා පද්ධති සහ ඩීසල් ජනක යන්ත්‍ර ඒකාබද්ධ කරමින් ක්‍රියාත්මක කෙරෙන දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය.

මෙම ව්‍යාපෘතිය පිළිබඳව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනනීය බලශක්ති සේවා අංශයේ සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) කුමාරි තෙන්නකෝන් මහත්මිය සමග සිදු කළ සංවාදය පහත දැක්වේ.

මෙම විශේෂිත දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියේ ආරම්භය පිළිබඳව සඳහන් කළොත්?

ඉන්දීය රජයේ ආධාර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබනවා. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කරනවා.

ඉන්දීය රජයේ ආධාර යටතේ ඉන්දීය සමාගමක් කොන්ත්‍රාත්කරු ලෙස සම්බන්ධ කර ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ අතර, ඒ අනුව 2024 මාර්තු 01 වැනි දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ව්‍යාපෘතිය ආරම්භ කළා. ව්‍යාපෘතියේ සමස්ත වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 10.995ක් වනවා.

මෙය සාම්ප්‍රදායික විදුලි බලාගාරයකට වඩා වෙනස් වූ දෙමුහුන් බලශක්ති පද්ධතියක්. සූර්ය බලශක්තිය, සුළං බලශක්තිය මඟින් ප්‍රධාන වශයෙන් විදුලිය සපයන අතර, අතිරික්ත බලශක්තිය ගබඩා කිරීම සඳහා බැටරි බලශක්ති ගබඩා පද්ධතියක්ද අන්තර්ගතයි. එයට අමතරව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ප්‍රමාණවත් විදුලිය ලබාගත නොහැකි අවස්ථාවලදී උපස්ථ බලශක්ති ප්‍රභවයක් ලෙස ඩීසල් ජනකයන්ත්‍ර භාවිත කිරීමට සැලසුම් කර තිබෙනවා.

දැනට ව්‍යාපෘතියේ කටයුතු කොපමණ ප්‍රමාණයක් අවසන් කර තිබෙනවාද?

දැනට සුළං බලශක්ති පද්ධතිය හැර අනෙකුත් ප්‍රධාන පද්ධති, සූර්ය බලශක්ති පද්ධති, බැටරි බලශක්ති ගබඩා පද්ධති, ඩීසල් ජනකයන්ත්‍ර ස්ථාපනය කර අවසන් කර තිබෙනවා.

මේ වන විට එම පද්ධතිවල පරීක්ෂණ, අභ්‍යන්තර පරීක්ෂණ සහ පෙරක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරමින් පවතිනවා. සුළං බලශක්ති පද්ධතියේ ස්ථාපන හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඉදිරියේදී අවසන් කිරීමට නියමිතයි.

මෙම ව්‍යාපෘතිය තුළ ඔබගේ භූමිකාව කුමක්ද?

මම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනනීය බලශක්ති සේවා අංශයේ සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස රාජකාරි කටයුතු සිදුකරනවා එහිදී මෙම ව්‍යාපෘතිය අප ආයතනයේ අප අංශයට පැවරුණු අවස්ථාවේ සිට ව්‍යාපෘතියේ ඉංජිනේරු ලෙස කටයුතු කරනවා. විශේෂයෙන්ම ව්‍යාපෘතියේ ලංසු ක්‍රියාවලිය, තාක්ෂණික කරුණු, කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම, ප්‍රගති අධීක්ෂණය සහ ව්‍යාපෘතියට අදාළ විවිධ තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් සම්බන්ධ වී සිටිනවා.

මෙම ව්‍යාපෘතිය යටතේ බලශක්ති පද්ධතියේ වපසරිය සහ ධාරිතාව පිළිබඳව පැහැදිලි කළොත්?

මෙම ව්‍යාපෘතිය යටතේ ඩෙල්ෆ් (Delft), අනලතිවු (Analativu) සහ නයිනතිවු (Nainativu) යන දූපත් තුනෙහිම දෙමුහුන් බලශක්ති පද්ධති ස්ථාපනය කෙරෙනවා. එක් එක් දූපතෙහි ව්‍යාපෘතිය සඳහා ආසන්න වශයෙන් අක්කර 23ක පමණ භූමි ප්‍රමාණයක් භාවිත කෙරෙනවා.

ඩෙල්ෆ් සහ නයිනතිවු දූපත්වල ස්ථාපිත කරන බලශක්ති පද්ධතිවල ධාරිතාවන් බොහෝ දුරට සමානයි. එම දූපත් දෙකෙහි සූර්ය බලශක්ති පද්ධතියේ ධාරිතාව ආසන්න වශයෙන් කිලෝවොට් 700ක් වන අතර, සුළං බලශක්ති පද්ධතිය කිලෝවොට් 250ක ධාරිතාවයකින් යුක්තයි. ඩීසල් ජනකයන්ත්‍රවල සමස්ත ධාරිතාව කිලෝවොට් 800ක් පමණ වන අතර, බැටරි බලශක්ති ගබඩා පද්ධතියේ ධාරිතාව කිලෝවොට් පැය 1,375ක් පමණ වනවා.

අනලතිවු දූපතේ බලශක්ති අවශ්‍යතාව සාපේක්ෂව අඩු බැවින් එහි ස්ථාපනය කෙරෙන පද්ධතිවල ධාරිතාව ද ඊට අනුරූපව අඩුයි. එහි සූර්ය බලශක්ති පද්ධතිය කිලෝවොට් 300ක පමණ ධාරිතාවයකින්ද, සුළං බලශක්ති පද්ධතිය කිලෝවොට් 250ක ධාරිතාවයකින්ද යුක්තයි. ඩීසල් ජනක යන්ත්‍රවල ධාරිතාව කිලෝවොට් 450ක් පමණ වන අතර, බැටරි බලශක්ති ගබඩා පද්ධතියේ ධාරිතාව කිලෝවොට් පැය 750ක් පමණ වනවා.

මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සහ අවසන් කිරීමට සැලසුම් කළ කාලසීමාව කුමක්ද?

මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු 2024 මාර්තු මස ආරම්භ කල අතර 2027 ජනවාරි අවසන් වනවිට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබෙනවා.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් දූපත් තුනේ විදුලි සැපයුමට සහ රටේ ආර්ථිකයට සිදුවන ප්‍රධාන බලපෑම කුමක්ද?

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ඩෙල්ෆ්, අනලතිවු සහ නයිනතිවු දූපත්වල පවතින විදුලි අවශ්‍යතාවය පුනර්ජනනීය බලශක්තිය මත වැඩි වශයෙන් පදනම් කරමින් සපුරාලීමයි.

දැනට මෙම දූපත් තුනෙහි විදුලි අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් ඩීසල් ජනකයන්ත්‍ර මඟින් සපයනු ලබනවා. එහිදී ඉන්ධන මිලදී ගැනීම පමණක් නොව, දූපත් වෙත ඩීසල් ප්‍රවාහනය කිරීම සඳහාද සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වෙනවා. විශේෂයෙන්ම මුහුදු මාර්ගයෙන්

අනාගතයේදී දේශීය බලශක්ති සම්පත් උපරිමයෙන් භාවිත කරමින්, පොසිල ඉන්ධන මත පවතින රඳාපැවැත්ම අඩු කිරීම සඳහා මෙවැනි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති තවදුරටත් සංවර්ධනය කිරීම වැදගත් වෙනවා.



ඉන්ධන ප්‍රවාහනය කිරීමේදී ගොඩබිම් ප්‍රවාහනයට සාපේක්ෂව අමතර වියදම් දැරීමට සිදුවනවා.

එමෙන්ම ඩීසල් ජනක යන්ත්‍ර මත රඳා පැවතීම හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යාම මෙන්ම ඉන්ධන සැපයුමේ ඇතිවන බාධා හේතුවෙන් විදුලි සැපයුමේ අඛණ්ඩතාවටද බලපෑම් ඇති විය හැකියි.

මෙම ව්‍යාපෘතිය මඟින් දූපත් තුනේ විදුලි අවශ්‍යතාවයෙන් සැලකිය යුතු කොටසක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීමට හැකි වන බැවින් ඩීසල් භාවිතය සහ ඒ සඳහා වැයවන ඉන්ධන හා ප්‍රවාහන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමට හැකියාව ලැබෙනවා. එමඟින් රටේ විදේශ විනිමය වියදම අඩු කිරීමට මෙන්ම දිගුකාලීනව විදුලිබල සැපයුමේ තිරසරභාවය වැඩි කිරීමටද දායක විය හැකියි.



සූර්ය, සුළං, බැටරි සහ ඩීසල් යන බලශක්ති ප්‍රභව හතර එකිනෙක සමග සම්බන්ධ කරමින් මෙම දෙමුහුන් පද්ධතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

මෙම දූපත් තුනට වසරේ වැඩි කාලයක් ප්‍රමාණවත් සූර්යාලෝකයක් ලැබෙනවා. ඒ නිසා දිවා කාලයේදී සූර්ය බලශක්ති පද්ධතිය මඟින් සැලකිය යුතු විදුලි ප්‍රමාණයක් නිෂ්පාදනය කළ හැකියි.

එමෙන්ම මෙම දූපත් ප්‍රදේශවල සුළං සම්පතද පවතින බැවින් සුළං බලශක්ති පද්ධතිය මඟින්ද විදුලිය නිෂ්පාදනය කළ හැකියි. මේ ආකාරයට සූර්ය හා සුළං බලශක්ති පද්ධති මඟින් නිපදවන විදුලිය පාරිභෝගික අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් වන අවස්ථාවලදී එම පුනර්ජනනීය විදුලිය සෘජුවම භාවිත කළ හැකියි.

එම අවස්ථාවේදී පරිභෝජනයට වඩා වැඩි විදුලි ප්‍රමාණයක් නිෂ්පාදනය වුවහොත් එම අතිරික්ත විදුලිය බැටරි බලශක්ති ගබඩා පද්ධතිය තුළ ගබඩා කර තබාගත හැකියි. පසුව සූර්ය හා සුළං බලශක්තිය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී එම ගබඩා කළ විදුලිය භාවිත කළ හැකියි.

ඒ අනුව සූර්ය බලශක්තිය, සුළං බලශක්තිය සහ බැටරි බලශක්ති ගබඩා පද්ධතිය මඟින් විදුලි අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමුඛතාව ලබා දෙන අතර, මෙම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සහ බැටරි පද්ධතියෙන් ප්‍රමාණවත් විදුලිය ලබාගත නොහැකි අවස්ථාවලදී පමණක් ඩීසල් ජනක යන්ත්‍ර උපස්ථ බලශක්ති ප්‍රභවයක් ලෙස භාවිත කිරීමට සැලසුම් කර තිබෙනවා.

මෙම ක්‍රමවේදය මඟින් ඩීසල් භාවිතය අවම කර ගැනීමටත්, ඒ හරහා ඉන්ධන පිරිවැය සහ කාබන් විමෝචනය අඩු කිරීමටත් හැකියාව ලැබෙනවා. එමඟින් පරිසර ආරක්ෂාවට මෙන්ම බලශක්ති සුරක්ෂිතතාවයටද වැදගත් දායකත්වයක් ලබා දිය හැකියි.

ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවලද මෙවැනි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ක්‍රියාත්මක කර තිබෙනවාද?

ඔව්. ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ නොවූ හුදෙකලා ප්‍රදේශවල විදුලි අවශ්‍යතාව සපුරාලීම සඳහා ජාලයෙන් පිටත (Off-grid) පුනර්ජනනීය බලශක්ති පද්ධති ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ගලමුදුන ගම්මානය සඳහා සූර්ය බලශක්තිය සහ බැටරි පද්ධතියක් භාවිතා කරමින් ජාලයෙන් පිටත විදුලිබල පද්ධති ස්ථාපනය කර තිබෙනවා. ජාතික විදුලිබල පද්ධතිය සමග සම්බන්ධ වීමට අපහසු හෝ එවැනි සම්බන්ධතාවක් ලබාදීම ආර්ථික වශයෙන් අභියෝගාත්මක කුඩා හා හුදෙකලා ගම්මාන සඳහා මෙවැනි පද්ධති වැදගත් විසඳුමක් ලෙස හඳුන්වා දිය හැකියි.

අනාගතයේදී දේශීය බලශක්ති සම්පත් උපරිමයෙන් භාවිත කරමින්, පොසිල ඉන්ධන මත පවතින රඳාපැවැත්ම අඩු කිරීම සඳහා මෙවැනි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති තවදුරටත් සංවර්ධනය කිරීම වැදගත් වෙනවා.

සංවාද සටහන - යූ. ඒ. රූපිකා

උපායමාර්ගික පාරිසරික බලපෑම් අධ්‍යයනයක්

ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණ හා මූල්‍ය ආධාර යටතේ, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනයේදී ඇතිවන පාරිසරික බලපෑම් අධ්‍යයන කිරීමේ ව්‍යාපෘතියක්, ඊට අදාළ මධ්‍යම රජයේ ආයතන හා අනෙකුත් ජාතික මට්ටමේ පාර්ශ්වකරුවන් සම්බන්ධ Scoping වැඩමුළුවක් 2026 ජූලි 13 දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මොනාෂ් ඉම්පීරියල් හිදී පවත්වනු ලැබීය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති මහාචාර්ය ටී. එම්. විජේන්ද්‍ර ජේ. බණ්ඩාර හා මෙම අධ්‍යයනය සිදු කරනු ලබන උපදේශන ආයතනය වන ඔරියන්ටල් කන්සල්ටන්ට් ග්ලෝබල් හී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ටොමෝකෝ හැටෝරි මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම වැඩමුළුව තුළින් ව්‍යාපෘතියේ අරමුණු හා සම්බන්ධීකරණ කටයුතු පිළිබඳ පැහැදිලි කරනු ලැබීය.

ඒ අනුව, මෙම ව්‍යාපෘතිය තුළින් උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක හතර තුළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සිදුකිරීමට හැකි ප්‍රදේශ මෙන්ම, සංවේදී කලාප කල් ඇතිව හඳුනාගැනීමටත්, ව්‍යාපෘති නොකළ යුතු ප්‍රදේශ මෙන්ම වැඩිදුර අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති සිදුකළ හැකි ප්‍රදේශ මෙන්ම අවම පාරිසරික බලපෑම් යටතේ ව්‍යාපෘති ආරම්භ කළ හැකි ප්‍රදේශ පිළිබඳව පැහැදිලි සිතියම්ගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

තවද මෙම ව්‍යාපෘතියේ උතුරු පළාත් Scoping වැඩමුළුව, 2026 ජූලි 08 දින යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී යාපනය, මන්නාරම, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි අදාළ රාජ්‍ය නිලධාරීන් හා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු විය.

චතුර වන්නිආරච්චි

ශ්‍රී ලංකාවේ වායු සමීකරණ බලශක්ති කාර්යක්ෂමතා පරීක්ෂණ රසායනාගාරය නිල වශයෙන් භාරදෙයි



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA), කොරියානු බලශක්ති ඒජන්සිය (KEA), කොරියානු දේශගුණික විපර්යාස පර්යේෂණ ආයතනය (KRIC), කොරියානු පරීක්ෂණ හා සහතික කිරීමේ ආයතනය (KTC) සහ ලංකා විදුලිබල සමාගම (LECO) එක්ව ක්‍රියාත්මක කළ "ශ්‍රී ලංකාවේ වායු සමීකරණ බලශක්ති කාර්යක්ෂමතා පරීක්ෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීම" ව්‍යාපෘතියේ සාර්ථක නිමාව සනිටුහන් කරමින් ව්‍යාපෘති ජයග්‍රහණ බෙදාගැනීමේ හා භාරදීමේ උත්සවය 2026 අගෝස්තු 05 දින කොළඹ දී පැවැත්විණි.

කොරියානු ශ්‍රී ලංකා විදේශ සංවර්ධන ආධාර (ODA) වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ වායු සමීකරණ යන්ත්‍රවල බලශක්ති කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය නවීන පරීක්ෂණ පහසුකම්, උපකරණ, තාක්ෂණික ලේඛන සහ මෙහෙයුම් පද්ධති මෙහි ස්ථාපිත කරන ලදී.

මෙම අවස්ථාවේදී රසායනාගාරය, අදාළ උපකරණ සහ තාක්ෂණික ලේඛන නිල වශයෙන් භාරදීම සිදු වූ අතර, ව්‍යාපෘතිය තුළින් අත්කරගත් ප්‍රධාන ජයග්‍රහණ හා ප්‍රතිඵල පිළිබඳවද අදහස් හුවමාරු කර ගන්නා ලදී. උත්සවයේ දෙවන අදියරේදී රසායනාගාරය පිහිටි LECO පුහුණු මධ්‍යස්ථානයේදී රසායනාගාර ඵලකය නිරාවරණය කිරීම ද සිදු කෙරිණි.

මෙම රසායනාගාරය ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂම වායු සමීකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම, බලශක්ති පරිභෝජනය අවම කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිතීන් හා පරීක්ෂණ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වැදගත් පියවරක් ලෙස සැලකේ. මෙම අවස්ථාව සඳහා කොරියානු ශ්‍රී ලංකා තානාපතිනි මියොන් ලී මැතිනිය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිතුමන්, අධ්‍යක්ෂ ජනරාල්තුමන් ලංකා විදුලි පුද්ගලික සමාගමේ සාමාන්‍යාධිකාරී, ආචාර්ය නරේන්ද්‍ර සිල්වා මැතිතුමන් ඇතුළු නිලධාරී මහත්ම මහත්මීන් රැසක් සහභාගී විය.

නිමල්කා සමරකෝන්

සූර්ය ජල පොම්ප භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩමුළුවක්



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව පසුගිය වසරේදී ආරම්භ කරන ලද ගොවීන් අතර සූර්ය ජල පොම්ප තාක්ෂණය ප්‍රචලිත කිරීමේ වැඩමුළු මාලාවේ තවත් එක් වැඩමුළුවක් අනුරාධපුර ඇලයාපත්තුවේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී 2026 අගොස්තු 25 දින පැවැත්විය.

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි දිල්හානි මහත්මිය විසින් සංවිධානය කළ මෙම වැඩමුළුව ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කැලුම් දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ඇලයාපත්තුව ගොවිජන සංවර්ධන බලප්‍රදේශය මෙන්ම අවට ප්‍රදේශවල ගොවීන් 180 කට අධික ප්‍රමාණයක් සහභාගී විය. මෙහි ප්‍රධාන සම්පත්දායක්වය පේරාදෙණිය ජාතික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන විද්‍යා ආචාර්ය චමිල ජානක පෙරේරා මහතා හා හේලීස් පෙන්ටන්ස් ආයතනයේ කළමණාකරු අජිත් පෙරියප්පෙරුම මහතා විසින් ලබා දෙන ලදී. සූර්ය බලශක්ති තාක්ෂණය හා නවීන ජල කළමණාකරනය පිළබඳ දැනුවත් කළ මෙම වැඩමුළුවේදී සූර්ය ජල පොම්ප ආනයනය හා විකිණීම් සිදුකරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ලියාපදිංචි ආයතන විසින් ප්‍රායෝගික අත්දැකීම් ගොවීන්ට ලබාදෙන ප්‍රදර්ශණ කුටි ඉදිරිපත් කර තිබුණි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ මීලඟ වැඩසටහනක් ඔක්තෝබර් හා නොවැම්බර් මාසයක්හි පේමුඩුව හා තණමල්විල ගොවිජන සංවර්ධන බලප්‍රදේශයන්හි දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

නිමල්කා සමරකෝන්

පොදු ගොඩනැඟිලිවල බලශක්ති කළමනාකරණය ඉහළ දැමීමේ වැඩමුළුවක්



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය GIZ ආයතනයේ PEEB COOL වැඩසටහන සමග එක්ව පොදු ගොඩනැඟිලි සඳහා බලශක්ති කළමනාකරණ ක්‍රමවේද ද හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන වැඩමුළුවක් 2026 ජූලි 14 සිට 17 දක්වා කොළඹ අමාරි හෝටලයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති මහාචාර්ය ටී. එම්. ජේ. විජේන්ද්‍ර බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් ඇරඹී මෙම වැඩසටහනේ පළමු දින ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන විද්වතුන් වෙනුවෙන් වෙන්ව තිබූ අතර ජූලි 15 සිට තෙදිනක් රාජ්‍ය ගොඩනැඟිලිවල බලශක්ති කළමනාකරුවන්ට වෙන්ව තිබුණි.

මෙහිදී ගොඩනැඟිලිවල බලශක්ති කළමනාකරණයට අදාළ ක්‍රමවේද ඇතුළත් 50005 සිට 50001 දක්වා බලශක්ති කළමනාකරණ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම මෙන්ම ප්‍රායෝගික භාවිතයට පිවිසීම කරා ගමන් කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම සිදු විය.

වැඩමුළුවේ සම්පත්දායකත්වය මහාචාර්ය රාහුල අතලගේ ආචාර්ය තරිඳු සමරසිංහ, ඉංජිනේරු රුවන් විජේමාන්න, ඉංජිනේරු හර්ෂ වික්‍රමසිංහ, ඉංජිනේරු සනත් කිත්සිරි මහතා ඇතුළු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉංජිනේරුවරුන් විසින් ලබා දෙන ලදී.

සත්සරණි ගංගොඩවිල